වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

ISSN 3121-3529

12 කාණ්ඩය 05 කලාපය

2026 ජූලි

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00

05 හෝද හෝද මඩේ දානවා ද? ගොවි බලයක් ගොඩ නගනවා ද?

06 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

08 සාපලත් කළු ජූලියේ සැඟවුණ තතු සොයායාම

09 ඔසප් බද්ද කාන්තාවන්ට ගහන ආර්ථික දඬය

11 එල් නිනෝ ගොඩ්සිලා කෙනෙක් වෙයිද?

අතුරුදන්කිරීම් ගැන සාක්ෂි දෙන්න ගෝඨා අධිකරණයට කැඳවයි

යුද්ධයේ හා යුද සමයෙන් පසු උතුර ඇතුළු රට පුරා සිදුව ඇති අතුරුදන්කිරීම් සම්බන්ධ සාක්ෂි දීමට ගෝඨාභය රාජපක්ෂට සිදුව තිබේ. 2011 දෙසැම්බර් මස 9 වැනිදා යාපනයේදී පැහැරගනු ලැබ ආරක්ෂක අංශ භාරයේ පසු වූ බව හෙළි වූ ලලිත් කුමාර් වීරරාජු සහ කුගන් මුරුගානන්දන් සම්බන්ධයෙන් යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන හබයාස් කෝපුස් නඩුවේදී සාක්ෂි දීම මගහැර සිටි හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මේ අනුව ජූලි මස 3වැනිදා එම අධිකරණය වෙත සාක්ෂි දීම සිදුවනු ඇත.

යුද සමයේ සහ ඉන්පසු අතුරුදන්කිරීම් සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් 10 වැනිදා මානව හිමිකම් දිනයේ මාධ්‍ය හමුවක් පැවැත්වීමට කටයුතු කරමින් සිටි ලලිත් හා කුගන් දෙදෙනා ඉන් පෙරදින යාපනයේ අවරන්ගල් ප්‍රදේශයේදී යතුරුපැදියකින් යමින සිටියදී සුදු වෑන් රථයකින් පැමිණ පැහැර ගෙන ගොස් ඇති බවට සාක්ෂි ඉදිරිපත් විය. එහිදී එම දෙදෙනාගේ ඥාතීන් විසින් අභියාචනාධිකරණයට ගොනු කළ හබයාස්කොපුස් පෙත්සම් විභාගවලදී සාක්ෂිකරුවන්ගේ ලේඛනයට එවකට ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ලෙස කටයුතු

02 වැනි පිටුවට..

ඒකපුද්ගල දරිද්‍රතා රේඛාව 17,000 ඉක්මවයි.

ජීවන වියදම ඉහළ යාමත් සමඟ පුද්ගල දිළිඳුකම් රේඛාව මසකට රු. 17,117 දක්වා ඉහළ ගොස් ඇතැයි වාර්තා වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම දත්තවලට අනුව, මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම හේතුවෙන් 2026 අප්‍රේල් මාසයේදී ජාතික නිල දිළිඳුකම් රේඛාව (OPL) එක් පුද්ගලයෙකු සඳහා මසකට රුපියල් 17,117 දක්වා ඉහළ ගොස් ඇත. එය මාර්තු මාසයේ පැවති රුපියල් 16,690ක අගයට වඩා වැඩි වීමකි.

රට පුරා ජීවන වියදමේ සිදුවන වෙනස්වීම් නිරීක්ෂණය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) සිදුවූ ඉහළ යාම මෙම වැඩිවීමට හේතු වූ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

දිස්ත්‍රික් මට්ටමේ දත්ත සලකා බැලීමේදී දිළිඳුකම් සීමාවන්හි කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබුණි. එහිදී ඉහළම දිළිඳුකම් රේඛාව කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර එය

02 වැනි පිටුවට..

ජනතා බලයක් වෙනුවෙන් විරෝධය කොළඹට

ජීවන බර අඩු කරන ලෙස ආණ්ඩුවට බල කරමින් ජන අරගල ව්‍යාපාරය මරදානේ සිට පැමිණි විරෝධතා පා ගමනට කොළඹ කොටුව දුම්රියපොළ ආසන්නයේදී පොලිසිය බාධා කළේය. නමුත් පොලිසියේ බාධා නොතකමින් විරෝධතාකරුවෝ කොළඹ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය අසලට පා ගමනින් පැමිණ එහිදී රැස්වීමක් පැවැත් වූහ.

රුපියල පහළ යාම සහ ඩොලරය ශක්තිමත්වීම ගැන බොරු කියලා ඇත්ත ප්‍රශ්න වහන්න බෑ!

පුබුදු ජයගොඩ සහෝදරයා

රුපියල අවප්‍රමාණය වීම ඇතුළු ආර්ථිකයේ තත්වය පිළිබඳ පෙරටුගාමී සමාජවාදී පක්ෂය කැඳවූ විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් නුගේගොඩ පිහිටි පක්ෂ කාර්යාලයේදී පැවැත්විණි.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ අධ්‍යාපන ලේකම් පුබුදු ජයගොඩ සහෝදරයා එහිදී අදහස් දැක්වූ අදහස් මෙසේය.

"අපි දැක්කා පසුගිය දවසක ජනාධිපතිවරයා ප්‍රකාශ කරනවා රුපියල අවප්‍රමාණය වෙන්න හේතුව ඇමරිකානු ඩොලරය ශක්තිමත් වීම කියලා. මැදපෙරදිග යුද්ධය තත්වයත් එක්ක ඩොලරයේ ඉල්ලුම ඉහළ යාම මේකට හේතුව විදිහට ආණ්ඩුව පැත්තෙන් පෙන්වනවා. නමුත් ආණ්ඩුව මේ කියන කරුණු සම්පූර්ණයෙන් වැරදියි. මොකද 2023 ජූනි වෙනකොට තිබුණු වටිනාකමටත් වඩා ඩොලරය මේ වෙද්දි තියෙන්නේ අඩු වටිනාකමක. අනිත් කාරණය තමයි සමස්ත ලෝකයේම සංචිත වලින් 2001අවුරුද්දේ වෙනකොට 72%ක් පමණ තිබුණු ඩොලර් ප්‍රමාණය 2025 අවුරුද්ද වෙනකොට 58% දක්වා පහළ වැටිලා ඉවරයි. අනිත් කාරණය තමයි ඉරානයට එරෙහිව ඇමරිකාව සහ ඊශ්‍රායලය එක්ව ආරම්භ කරපු අධිරාජවාදී යුද්ධයන් පස්සේ හෝමුස් සමුදු සන්ධිය හරහා වෙන වෙළඳාම් පවා වෙන්නේ යුවාන් සහ රූබල් කියන මුදල් ඒකක මත. අනිත් පැත්තෙන් බ්‍රික්ස් රටවල මැදිහත්වීමක් ඩොලරයට විශාල තර්ජනයක් වෙලා තියනවා. ඒක නිසා ලංකාවේ රුපියල අවප්‍රමාණය වීමට හේතුව ඇමරිකානු ඩොලරය ශක්තිමත් වීම කියලා ආණ්ඩුව කියන කරුණු වැරදියි කියලා හොඳටම පැහැදිලියි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආර්ථික ප්‍රතිපත්තිය කරගහගෙන ආණ්ඩුව මේ යන ගමන නිසා ඉදිරියේදී ලංකාවේ ආර්ථිකය විශාල අර්බුදයකට යන්න නියමිතයි කියලා අපි ආණ්ඩුවට අනතුරු ඇඟවීමේ මිට අවුරුද්දකට කලින් ඉඳලා. හැබැයි ආණ්ඩුව ඒ වෙලාවේ නෑ නෑ අපි දන්නවා කරන විදිහ කියලා පරණ පුරුදු නවලිබරල් වැඩපිළිවෙළේම ගියා. දැන් මේ භුක්ති විඳින්න වෙලා තියෙන්නේ ඒ අත්තනෝමතික තීරණවල ප්‍රතිඵල තමයි. වාහන ආනයන සීමා ලිහිල් කරන්න එපා එහෙම කළොත් ඩොලර් බිලියන 2ක විතර විදේශ විනිමය සංචිත ප්‍රමාණයක් අපිට අහිමි වෙනවා කියලා පෙරටුගාමී සමාජවාදී පක්ෂය විදිහට අපි 2024 අවුරුද්දේ දෙසැම්බර් 20 මාධ්‍ය හමුවකදී පැහැදිලි කළා. නමුත් ඒවා අහන්නැතුව ආණ්ඩුව වාහන ගෙන්වන්න තීරණය කරපු එකෙන් දැන් අපේ විදේශ විනිමය සංචිත වලින් ඩොලර් බිලියන 2.4ක් අහිමි වෙලා ඉවරයි. අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහනවා වගේ දැනුයි ආණ්ඩුවට වාහන ආනයනය සීමා කරන්න මතක් වෙලා තියෙන්නේ. මේ ගෙන්වපු වාහන වලිනුත් බස් තියෙන්නේ 700ක් වගේ ප්‍රමාණයක් ඉතුරු වාහන ලක්ෂ තුනක් විතර තියෙන්නේ පෞද්ගලික පරිහරණයට ගෙන්නපු වාහන. මේවගෙන් වැඩි ප්‍රමාණයක් තියෙන්නේ අධි සුඛෝපභෝගී වාහන. ඒවට විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වෙනවා. ඒ නිසා රටේ ඉන්ධන පරිභෝජනයත් මේ වෙද්දි ඉහල ගිහිල්ලා තියෙන්නේ.

දැන් අනිල් ජයන්ත ඇමතිවරයා ඇවිල්ලා කියනවා ඩොලරයේ මිල ඉහළ යාම අපිට වාසියි කියලා. හැබැයි ඔහුට අමතක වෙලා ඒ වාසිය ලැබෙන්නේ අපනයන කර්මාන්ත හිමියන්ට කියන එක. හැබැයි ඒකෙන් අර ගාමන්ට් එකේ වැඩ කරන ආණ්ඩුවට ඡන්දෙ දීපු ඇඟළුම් කර්මාන්ත සේවිකාවන්ගේ ආදායම එක රුපියලකින් වැඩි වෙන්නේ නැහැ. කම්පැනි කාරයෝ ටිකක් ලාභ හොයන එක විතරයි මේකෙන් වෙන්නේ. අප්‍රේල් මාසේ තිබුණු තත්වයට සාපේක්ෂව මේ වෙද්දි උද්යමනය දෙගුණයකින් වැඩි වෙලා. කවේකට ගිහිල්ලා මනුස්සයෙක්ට බඩුවක් ගන්න විදිහක් නෑ. හාල්, පරිප්පු, අල, ලුණු, කිරිපිටි මේ හැම එකකම මිල දවසින් දවස වැඩි වෙමින් යනවා. රුපියල කඩා වැටීම නිසා අර්බුදය මුළුමනින්ම ඇවිත් තියෙන්නේ පහළ පන්තියේ ජනතාවගේ කර උඩට. වැඩ කරන ජනතාවගේ ජීවිත තමයි මේ අර්බුදයට යන්නේ. ආණ්ඩුව මේ පන්ති ප්‍රශ්නය අමතක කරලා තමයි ඩොලරයේ ඉහළ යාම වාසියි කියලා කයිවාරු ගහන්නේ.

දැන් ආණ්ඩුව මේ ප්‍රශ්නේ යට ගහන්න පාවිච්චි කරන්නේ ඉන්දියාව. ඉන්දියානු රුපියලත් පහළ වැටිලා තියෙන්නේ ඇයි අපේ වුණාම මොකද වගේ කතා කියලා ආණ්ඩුව මේක යට ගහන්න ලෑස්ති වෙනවා. ආණ්ඩුව හිතාගෙන ඉන්නේ ඉන්දියාව ස්වර්ග රාජ්‍ය කියලද දන්නේ නැහැ. ඉන්දියාවේ ඉන්නේ කෝටිපතියන්ට සාපේක්ෂව අතිවිශාල දිළිඳු ජනතාවක් ඉන්දියාවේ ඉන්නවා. ඉන්දියාව ආර්ථික බලවතෙක් වුණාට ඒ රටේ ජනතාවගේ ජීවිත තියෙන්නේ විශාල අර්බුදයක. ඒ නිසා ආණ්ඩුව ඉන්දියාව පෙන්නලා බේරෙන්න යනව නම් ඒක වැරදියි.

අපි මේ ප්‍රශ්නේ එනකොටම ආණ්ඩුවට විසඳුම් කිහිපයක් යෝජනා කළා. අපි ආණ්ඩුවට අනතුරු ඇඟෙව්වා වාහන ආනයන සීමා ලිහිල් කරන්න එපා එහෙම වුණොත් ඒක ආර්ථිකයට විශාල බලපෑමක් කරනවා කියලා. ඊළඟට අපි කිව්වා මැදපෙරදිග යුද්ධය එක්ක ඉන්ධන අර්බුදයක් එන්න පුලුවන් ඒ නිසා වහාම අපේ රටට අවශ්‍ය ඉන්ධන සංචිත ගබඩා කරගන්න පියවර ගමු කියලා. අන්ති පැත්තෙන් පළවෙනි දෙවෙනි ගල් අඟුරු නැව් ෆෙල් වෙනකොටම අපි කිව්වා ඉදිරියේදී බලශක්ති අර්බුදයක් ඇතිවෙන්න නියමිතයි ඒ නිසා ඉක්මනින් ටෙන්ඩරය අවලංගු කරලා ප්‍රමිතියෙන් යුතු ගල් අඟුරු ගෙන්වන්න වැඩක් හදන්න කියලා. මේ කියපු කිසි දෙයක් ගණං නොගෙන ඉඳලා දැන් ආණ්ඩුව අපි මොනවා කරන්නද වගේ කතා කියලා මේ ප්‍රශ්නෙන් ගැලවෙන්න තමයි ලෑස්ති වෙන්නේ.

රුපියල බාල්දු වීමට හේතුව විදිහට ආණ්ඩුව මේ සෙනන්නේ උඩින් තියෙන තාක්ෂණික ප්‍රශ්න ටික විතරයි. ඇත්ත ප්‍රශ්නය තියෙන්නේ අපේ ආර්ථික පදනම ඇතුලේ. පසුගිය කාලේ අත්තනෝමතික විදිහට ආණ්ඩු ගත්ත ණය නිසා දැන් අපි ඉන්නේ ආර්ථික උගුලක හිරවෙලා. අපේ විදෙස් ණය ප්‍රමාණය අපිට ගෙවාගන්න බැරි තරම් ඉහළ ගිහිල්ලා. අනෙක් පැත්තෙන් අපේ ආනයන සහ අපනයන අතර පරතරය එන්න එන්නම වැඩි වෙනවා. අපි විදෙස් රටවලට භාණ්ඩ විකුණලා ගන්න ඩොලර් ප්‍රමාණයට වඩා වැඩි ඩොලර් ප්‍රමාණයක් මේ රටට භාණ්ඩ ගෙන්නන්න වැය වෙනවා. තුන්වෙනි කාරණය තමයි අපේ රටේ නිශ්පාදන ආර්ථිකයේ කඩා වැටීම. අපේ රටේ මේ ආර්ථිකයෙන් 33%යි නිෂ්පාදන කර්මාන්ත හරහා දුවන්නේ. සමස්ථ ආර්ථිකයෙන් 77%ක්ම තියෙන්නේ ආනයන සහ ණය මගින් කරන දේවල්.

මෙන්න මේ තත්වය තේරුම් අරගෙන ආණ්ඩුව දැන්වත් ආනයන සීමා කිරීමකට යන්න ඕන. ඊට සාපේක්ෂව දේශීය නිශ්පාදන දියුණු කරන්න කඩිනම් පියවරක් ගන්න වෙනවා. අපි මේ ණය උගුලක හිර වෙලා ඉන්න නිසා තමයි ලෝකෙ වෙන රටවලට කිව්සුමක් ගියත් අපිට නියුමෝනියාව හැදෙන්නේ. ඒ තත්වය නවත්වන්න නම් මේ ණය උගුලෙන් ගැලවෙන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ වහාම ගන්න ඕන. ඒක කරන්න තමයි ආණ්ඩුවට ජනවරමක් ලැබුණේ. අපේ රටට ආයෝජකයෝ ආවා කියලා මෙහේ ආර්ථිකය ශක්තිමත් වෙන්නේ නැහැ. මොකද ඒගොල්ලො කරන්නේ තමන්ගේ ආයෝජන හරහා විශාල ලාභයක් උපයගෙන ආයොජනත් අකුලගෙන නැවත තමන්ගේ රටවලට යන එක. අපිට සොච්චමක්වත් ඉතුරු වෙන්නේ නැහැ. ඡඡ එක කියන විදිහට තව තව ණය ගන්න එක තමයි දැන් ආණ්ඩුව විසඳුම විදිහට තෝලා තියෙන්නේ. හැබැයි ඒකෙන් වෙන්නේ අපේ රටේ දුප්පත් මිනිස්සුගේ කරපිට විශාල බදු බරක් පැටවෙන එක. ඒකෙන් ජනතාවගේ ක්‍රය ශක්තිය එන්න එන්නම පහත වැටෙනවා. මේකෙන් මුලින් කඩා වැටෙන්නේ සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්ත ටික. නිශ්පාදන ආර්ථිකය දුර්වල කරන ආණ්ඩුවේ ප්‍රතිපත්තිත් මේකට බලපාලා තියනවා.

මේ හැම තත්වයක් එක්කම අපිට පේන්න තියෙන දේ තමයි ආණ්ඩුව මේ යන පාර වෙනස් නොකලොත් රටක් විදිහට අපි ඉදිරියේදී විශාල අර්බුදයකට යන්න නියමිතයි කියන කාරණය. ඒ නිසා අපි ආණ්ඩුවට මතක් කරනවා දැන්වත් ධනපතියන් අතලොස්සක් පිනවමින් මේ ගෙනියන ජනතාදෝහී ආර්ථික වැඩපිළිවෙළෙන් ඉවත් වෙලා විකල්ප ආර්ථික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. මොකද ආණ්ඩුවට ඡන්දය දුන්නු මිනිස්සුන්ගේ ජීවිත අර්බුදයට ඇදලා දාන්න ආණ්ඩුවට කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ. අනිත් එක අර්බුදය ලෝක මට්ටමින් මතුවෙනවා කියලා ඒකෙන් ගැලවෙන්න ආණ්ඩුවට බැහැ. මොකද ජනතාව ආණ්ඩුවට ඡන්දය දුන්නේ ලෝක මට්ටමින් ආවත් දේශීයව ආවත් ඕනෑම අර්බුදයකට ප්‍රතිපත්තියමය විසඳුම් හොයන්න. පිටරට වෙන දේවල් දිහා බලලා අපේ රටේ හාණ්ඩවල මිල වැඩි කරන්න නම් ජනාධිපතිවරයෙක් මොකටද කියලා ඒ කාලේ ඇඳුවේ දැන් ඉන්න ජනාධිපති අනුරදිසානායකම තමයි. අපි කියනවා ඔහුගෙනුත් ජනතාව ඔය ප්‍රශ්නයම අහන්න කලින් වහාම ජනතාවාදී ආර්ථික ක්‍රියාවලියකට යන්න කියලා."

01 පිටුවෙන් ....

අතුරුදන් කිරීම් ගැන....

කළ ගෝඨාභය රාජපක්ෂ ඇතුළත් කරන ලදී. එම පෙත්සම් අනුව, අදාළ අතුරුදන්කිරීම් සම්බන්ධ සාක්ෂි විභාග කොට අතුරුදන්කිරීම් පිළිබඳ වාර්තාවක් සපයන ලෙස යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයට නියෝග කෙරිනි. ඒ අනුව යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගය 2012 සැප්තැම්බර් 19 වැනිදා ආරම්භ වූ අතර සාක්ෂිකරුවන්ට අධිකරණය හමුවට පැමිණෙන ලෙස ලබාදුන් නියෝග නොතකා හරිමින් ගෝඨාභය රාජපක්ෂ විවිධ හේතු සපයන ලදී.

ඔහු ඉදිරිපත් කළ ප්‍රධාන හේතු දැක්විමක් වූයේ යුද සමයේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කළ බැවින් යාපනයේ අධිකරණයට පැමිණීමේදී ආරක්ෂක තර්ජනයක් ඇති බවයි. එහෙත් 2019 ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයකු වශයෙන් ඔහු යාපනයේ ප්‍රසිද්ධ රැස්වීම්වලට හා රටපුරා මහජන රැස්වීම්වලට සහභාගි වීමේදී කිසිදු ආරක්ෂක තර්ජනයක් නොවූ බවයි. කෙසේවුවද ඔහුගේ ඉල්ලීම මත මාර්ගගත ක්‍රමයට සාක්ෂි ලබාදීමට යාපනය මහෙස්ත්‍රාත් අධිකරණය විසින් දින නියම කරන ලදී. ඒ අනුව ජූලි මස 3වැනිදා යාපනයේ පැවැත්වෙන නඩු විභාගයේදී මාර්ගගත ක්‍රමයට සාක්ෂි දෙමින් ලලිත් හා කුගන් සහෝදරවරු පැහැරගැනීමත් ආරක්ෂක අංශ භාරයේ තබා ගැනීමත් අතුරුදන් කිරීමත් සම්බන්ධ සාක්ෂි දෙන්නට ගෝඨාභය රාජපක්ෂට සිදුවනු ඇත.

ඒකපුද්ගල දරිද්‍රතා....

එක් පුද්ගලයෙකු සඳහා මසකට රුපියල් 18,461 ක් විය. දෙවන ඉහළම අගය ලෙස ගම්පහ දිස්ත්‍රික්කයෙන් රුපියල් 18,367 ක් වාර්තා විය.

නුවරඑළිය සහ කළුතර දිස්ත්‍රික්කවල ද සාපේක්ෂව ඉහළ දිළිඳුකම් රේඛාවන් වාර්තා වූ අතර, එම අගයන් පිළිවෙළින් රුපියල් 18,001ක් සහ රුපියල් 17,968ක් විය. අඩුම දිස්ත්‍රික් දිළිඳුකම් රේඛාව රුපියල් 16,367 ක් ලෙස මොනරාගල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.

මේ අතර, අප්‍රේල් මාසයේදී සියලුම ආර්ථික කටයුතු සඳහා වන නිෂ්පාදක මිල දර්ශකය (PPI) 241.5 ක් ලෙස සටහන් වූ අතර, මැයි මාසය සඳහා වන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) 203.4ක් ලෙස වාර්තා විය.

නිල දරිද්‍රතා රේඛාව ගණනය කරනු ලබන්නේ, 2021 වර්ෂය පදනම් වර්ෂය හා 2021දී අගය ඒකක 100ක් ලෙස ගෙන සැකසූ ජාතික පාරිභෝගික මිල දර්ශකය භාවිතයෙනි. එමගින් පුද්ගලයෙකුට තම මූලික ආහාර සහ ආහාර නොවන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය අවම මාසික වියදම නිරූපණය කෙරේ.

මූලින් 2012/13 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත පදනම් වූ මෙම දිළිඳුකම් රේඛාව, මිල ගණන් සහ ජීවන වියදම්වල සිදුවන වෙනස්වීම් පිළිබිඹු කිරීම සඳහා වරින් වර සංශෝධනය කරනු ලබයි.

මෙම නවතම සංඛ්‍යාලේඛන මඟින් පසුගිය දශකය තුළ ජීවන වියදම සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති ආකාරය මනාව පැහැදිලි කරයි.

2012/13 සමීක්ෂණ කාලසීමාව තුළ ජාතික දරිද්‍රතා රේඛාව පැවතියේ එක් පුද්ගලයෙකු සඳහා මසකට රුපියල් 5,223ක් වශයෙනි. 2026 අප්‍රේල් වන විට එම අගය තුන් ගුණයකට වඩා වැඩි වී ඇති අතර, එමඟින් පවුල්වල මිලදී ගැනීමේ ශක්තිය කෙරෙහි උද්ධමනයෙන් එල්ල වී ඇති අඛණ්ඩ බලපෑම ඉස්මතු කර පෙන්වයි.

වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත
අංක 22/1, මෝල්ඩර් පෙදෙස, නුගේගොඩ.
flsocialistparty@gmail.com
wama.editor@gmail.com

බඩු මිල ඉහළට - ජන ජීවිත පහළට...

ජනතාවගේ බලාපොරොත්තු, අපේක්ෂා සහ විරෝධතා රැල්ල මත බලයට පත්වූ ජාතික ජන බලවේග (NPP) ආණ්ඩුව අද වන විට ගමන් කරමින් සිටින්නේ ජනතාව අපේක්ෂා කළ දිශාවට නොව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ඡඡඊ කොන්දේසි මත ගොඩනැගුණු නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියේම මාවතේය. මැතිවරණ වේදිකාවල දූෂණයට එරෙහිව, බඩු මිල පහත හෙළන බවට, බදු බර සාධාරණ කරන බවට සහ ජනතාව කේන්දු කරගත් ආර්ථිකයක් ගොඩනගන බවට ලබාදුන් පොරොන්දු අද වන විට ආණ්ඩුවේ ක්‍රියාවෙන්ම ප්‍රතික්ෂේප වෙමින් තිබේ.

ජනතාවට අද දැනෙන්නේ 'වෙනස' නොව, දෛනික ජීවිතය දරාගැනීමේ අරගලය තවත් උග්‍ර වී ඇති බවයි. සහල්, පොල්, එළවළු, මාළු, බිත්තර, කිරිපිටි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා සාමාන්‍ය පවුලක මාසික වියදම අසීමිත ලෙස වැඩි වී තිබේ. බදු බර තවදුරටත් ජනතාවගේ කර මත පැටවෙමින් තිබේ. ආර්ථික අර්බුදයේ වන්දිය ගෙවන්නේ නැවතත් කම්කරුවා, ගොවියා, ධීවරයා, වැටුප් සේවකයා සහ සුළු ව්‍යාපාරිකයාය.

ආණ්ඩුව පෙන්වා දෙන්නේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන බවයි. ඇත්තෑමි ආර්ථික දර්ශක ද යහපත් අතට හැරෙමින් තිබෙන බව සඳහන් කරයි. එහෙත් ආර්ථික සංඛ්‍යා ලේඛනවල පෙනෙන වර්ධනය සහ ජනතාවගේ කෑම මේසය මත පෙනෙන යථාර්ථය අතර පරතරය දිනෙන් දින පුළුල් වෙමින් තිබේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත හා 2026 මැයි මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව උද්ධමනය සියයට 5.4 දක්වා ඉහළ ගොස් ඇත. මෙම සංඛ්‍යාව අඩු මට්ටමක පෙනුණද, දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල ඉහළ යාමේ බර ජනතාවට තවමත් දරාගත නොහැකි තත්වයක පවතී.

ජීවන වියදම ඉහළ යාමේ සෘජු ප්‍රතිවිපාකය දරුවන්ගේ සහ පවුල්වල පෝෂණ තත්ත්වය තුළ පැහැදිලිව දැකගත හැකිය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නවතම දත්ත අනුව වයස අවුරුදු පහට අඩු දරුවන්ගෙන් 16.1%ක් අඩු බරින්ද, 10.1%ක් වර්ධනය අඩාල වූ තත්වයෙන්ද, 8.6%ක් ක්ෂයවීම් තත්වයෙන්ද පසුවෙති. එනම් සෑම දරුවන් පස් දෙනෙකුගෙන් එක් අයෙකු පමණ යම් ආකාරයක මන්දපෝෂණයකට ගොදුරු වී සිටී. මෙය සංඛ්‍යා ලේඛනයක් පමණක් නොව, ආර්ථික ප්‍රතිපත්තිවල සමාජ පිරිවැය පිළිබඳ බරපතළ අනතුරු ඇඟවීමකි.

මෙම තත්ත්වය අහම්බයක් නොවේ. IMF වැඩසටහන යටතේ රාජ්‍ය වියදම් කප්පාදු කිරීම, බදු ආදායම් වැඩි කිරීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ වෙළෙඳපොළට වැඩි ඉඩක් ලබාදීම නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියේ අනිවාර්ය අංගයන්ය. ආණ්ඩුවද අද ක්‍රියාත්මක කරමින් සිටින්නේ එම වැඩසිළිවෙළයි. එහි බර දරන්නේ ජනතාවය. එහි ප්‍රතිලාභ හිමිවන්නේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රාග්ධනයටය.

ඒ සමගම ඉන්දියාව, ඇමරිකාව සහ අනෙකුත් බලවත් රාජ්‍යයන් සමග ඇති කරගන්නා ආර්ථික හා උපායමාර්ගික සබඳතා තුළද ජාතික ආර්ථිකයේ ස්වාධීනත්වයට වඩා විදේශීය ප්‍රාග්ධනයේ අවශ්‍යතාවලට ප්‍රමුඛතාව ලබාදෙන ප්‍රවණතාවක් දක්නට ලැබේ. ජනතාවගේ අවශ්‍යතා මත නොව, ණය දෙන ආයතන සහ මහා බලවතුන්ගේ අවශ්‍යතා මත ආර්ථිකය හැසිර ඇස්වීමෙන් සැබෑ ප්‍රතිසංස්කරණයක් බිහි විය නොහැක.

රාජ්‍ය සම්පත් සම්බන්ධයෙන්ද ආණ්ඩුවේ ක්‍රියාමාර්ග ජනතා අපේක්ෂාවට පටහැනිය. ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන 'ප්‍රතිව්‍යුහගත කිරීම' යන නාමයෙන් පෞද්ගලික හා විදේශීය ප්‍රාග්ධනයට විවෘත කිරීමේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යමින් සිටී. මැතිවරණ සමයේ රාජ්‍ය සම්පත් ආරක්ෂා කරන බවට දුන් පොරොන්දු ක්‍රියාවෙන් අතහැර දමා ඇත. රාජ්‍ය දේපළ වෙළෙඳ භාණ්ඩ බවට පත් කිරීම ආර්ථික ගැලවීමක් නොව, ජනතාව සතු සම්පත් ප්‍රාග්ධනයට පැවරීමකි.

ජනතාව පීඩාවට පත් කරන මෙවැනි ආණ්ඩුකරණයක් මාළිමා ආණ්ඩුවෙන් බලාපොරොත්තු නොවූවන්, අද ඉදිරියට පැමිණ ඇති යථාර්ථය එයයි. ඉතිහාසය පුරා ජනතා අපේක්ෂා සහ වෙනස පිළිබඳ බලාපොරොත්තු මත බලයට පත්වූ ජනකාන්ත දේශපාලන බලවේග අවසානයේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියම ශක්තිමත් කරමින් දේශීය හා ජාත්‍යන්තර ධනපති පන්තියේ අවශ්‍යතා ඉටු කරන පාලන යන්ත්‍ර බවට පරිවර්තනය වී තිබේ. අඳඳ සිදුවන්නේ එම ඉතිහාසයේම තවත් පුනරාවර්තනයකි.

එබැවින් මේ අර්බුදයට පිළිතුර තවත් ආණ්ඩු මාරුවක් හෝ තවත් ජනකාන්ත නායකයකු බලයට පත් කිරීම නොවේ. අවශ්‍ය වන්නේ කම්කරුවන්, ගොවීන්, ධීවරයන්, තරුණයන්, කාන්තාවන් සහ පීඩාවට පත් සියලු ජන කොටස් තමන්ගේම ස්වාධීන දේශපාලන බලය ගොඩනගා ගනිමින් සමාජ පරිවර්තනයේ දිශාවට සංවිධානය වීමයි. ධනපති ආර්ථික ක්‍රමය තුළ පාලකයන් මාරු කිරීමෙන් ජනතාවගේ ජීවිත වෙනස් නොවන බව නැවතත් සනාථ වී තිබේ.

මහජනයාගේ බලය මහජනයා විසින්ම අභ්‍යාස කරන ප්‍රජාතන්ත්‍රවාදී ජනතා බලයක් ගොඩනැගීම අද දවසේ වාමාංශික හා ප්‍රගතිශීලී බලවේග හමුවේ ඇති ප්‍රධාන දේශපාලන අභියෝගයයි. ජනතාවගේ සංවිධානාත්මක බලයෙන් නොවව සැබෑ සමාජ පරිවර්තනයක් සිදු නොවන බව ඉතිහාසය නැවත නැවතත් අපට උගන්වා ඇත.

අත්ත බිඳෙයි - පය බුරුලෙන්...

මේ දිනවල කතාබහට ලක් වී ඇත්තේ වත්මන් අගවිනිසුරු ප්‍රීති පද්මන් සූරසේන අගවිනිසුරුවරයාගේ ධුර කාලය මෙම වසර අවසන් භාගයේ අවසන් වීමයි. ඔහු විශ්‍රාම යද්දී එක්කෝ වෙනත් අගවිනිසුරුවරයෙකු නම් කළ යුතු අතර, නැතිනම් ඔහුගේ ධුර කාලය දිගු කළ යුතුය. අගවිනිසුරුවරයෙකුගේ ධුර කාලය දීර්ඝ කරන්නේ නම්, ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය. මෙම ලිපිය ලියන මොහොත වනවිට ලැබෙන වාර්තා සියල්ල පවසන්නේ වත්මන් ආණ්ඩුව ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීමේ සැලසුමක සිටින බවයි. බොහෝ පාර්ශ්ව එය අධිකරණ ක්ෂේත්‍රයට විධායකය විසින් කරන අනිසි අතපෙවීමක් ලෙස සලකා එයට විරෝධය පළකරති. නිදසුනක් ලෙස කොළඹ නීති සමාජය (Colombo Law Society) ජූලි 2 වැනිදා මෙම සම්බන්ධයෙන් අප්‍රසාදය පළකරමින් ජනාධිපතිවරයාට ලිපියක් යැවූ අතර ශ්‍රී ලංකා නීතිඥ සංගමය (Sri Lanka Bar Association) ජූලි 4 වැනිදා පැවති මහජන අදහස් විමසීමකදී තමන්ගේ විරෝධය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළේය. නමුත් ආණ්ඩුව එම විරෝධතා නොසලකා මුරණ්ඩු ලෙස සිය මුල් තීරණයේම සිටින බවක් පෙනේ.

දේශපාලන විද්‍යාවේ සම්භාව්‍ය න්‍යායික නිර්වචනවලට අනුව විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර තුළින බලතල බෙදාහැරීමක් තිබෙන බවත්, විශේෂයෙන් අධිකරණය දේශපාලන තන්තුයේ බලපෑමෙන් ස්වාධීන බවත් තහවුරු කර තිබේ. නමුත් ලංකාවේ මේ සම්බන්ධයෙන් අපගේ සංයුක්ත අත්දැකීම එම න්‍යායික නිර්වචනවලට වඩා බෙහෙවින් වෙනස්ය. ඒ ගැන ගෙවුණු ඉතිහාසය පුරා අගවිනිසුරු ධුරයට පුද්ගලයන් නම් කිරීමේදී දේශපාලන තන්තුය කළ මැදිහත්වීම් ගැන විමසා බැලීම පමණක් වුව ප්‍රමාණවත් වේ.

ලංකාවේ පළමු දේශීය ධනේශ්වර පාලනය වූ ඩී. එස්. සේනානායකගේ

ආණ්ඩුවේ සිටම මේ ගැන අත්දැකීම් ඇත. 1948 වනවිට ලංකාවේ අගවිනිසුරු ලෙස පත්වීම සඳහා සුදුසුකම් ලබා සිටියේ එවකට ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරයා වූ රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායකය. ඩී. එස්. සේනානායක අගවිනිසුරු ලෙස පත් කළේ එවකට නීතිපතිවරයාව සිටි ආතර් විජේවර්ධනටය. ඒ පැහැදිලිවම රේශපාලන හේතු මතය. රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායකගේ පුත්‍රයා වන ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක 1970 -77 ආණ්ඩුවේ අධිකරණ ඇමතිවරයා වූ පසුව ඔහු ක්‍රියා කළේත් ඒ ආකාරයටමය. සිය ඥාතියෙකු හා අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායකගේ ඥාතියෙකු වන බාන්ස් රත්වත්තේ පහළ අධිකරණයක විනිසුරුවරයෙකුව සිට එකවරම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු ලෙස උසස්වීමක් ලද්දේය. ඔහුව අභියාචනාධිකරණයේ සභාපති ලෙසද පත් කරනු ලැබීය. ඉහල අධිකරණ සියල්ලම පාහේ සිය ඥාතීන්ගෙන් සහ මිතුරන්ගෙන් පිරවීමට සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රියා කළාය. ඒ කාලයේ ක්‍රිකට් සහ පාපන්දු තරඟවල ක්‍රීඩා විනිසුරුවරයකු සැක සහිත තීන්දු දෙනවිට ප්‍රේක්ෂකයෝ මෙම සුදුසුකම් නැති හා ආණ්ඩු හිතවාදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ නම් කියා කෑ ගැසූ බවද සඳහන් වේ.

මේ සම්බන්ධයෙන් ජනතාව තුළ පැවති බලවත් විරෝධය භාවිතා කරමින් බලය ගත් ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව අගවිනිසුරු ධුරය ලබා දුන්නේ ජනාධිපතිවරයාගේ මිතුරෙකු වූ රාජ නීතිඥ නෙවිල් සමරකෝන් හටය. සාමාන්‍ය නීතිඥයෙකු අගවිනිසුරු ලෙස පත්කළ ලංකා ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව එය විය. ඊට අමතරව සිය රේශපාලන හෙංචයියන්ගෙන් විනිසුරු පුටු පිරවූ ජේ. ආර්. ආණ්ඩුවට අවාසිදායක තීන්දු දුන් විනිසුරුවරුන්ගේ නිවෙස් ඉදිරියට පාතාල මැරයන් යවා හූ කීමට සැලැස්වීය.

1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනිය වනවිට අගවිනිසුරු ධුරයේ සිටියේ ජී. පී. එස්. සිල්වා වන අතර ඔහු 1999දී විශ්‍රාම ගියේය. ජ්‍යෙෂ්ඨත්වය අනුව ඊළඟට එම තනතුරට සුදුසුකම් ලබා සිටියේ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා වුවත් ඔහුට අකමැතිවූ චන්ද්‍රිකා අගවිනිසුරු ධුරය ලබා දුන්නේ එවකට නීතිපතිවරයාව සිටි ආණ්ඩුවේ හිතවතෙකු වන සරත් එන්. සිල්වාටය. 2005දී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඔහු විශ්‍රාම යාමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨයකු වූ අශෝක ද සිල්වා සහ ඔහුගෙන් අනතුරුව ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරු ධුරයට පත් කරන ලදී. අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක බැසිල් රාජපක්ෂට එරෙහි තීන්දුවක් ලබාදීම නිසා ඇයට එරෙහි දෝ

දේශපාලන කතිකය

නිර්ප්‍රභූ බැටළු හම ප්‍රභූ වෘකයෝ

ජූනි මාසයේ දෙවන සතියේදී කෘෂිකර්ම ඇමති කේ. ඩී. ලාල්කාන්ත ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කළේය. ප්‍රභූ පන්තිය අතින් නිර්ප්‍රභූ පන්තියට බලය මාරුවූ බවත් යළි ප්‍රභූ පන්තියට බලය ගැනීමට ඉඩ නොතබන බවත් ඇමතිවරයා පැවසීය. ඒ පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට නව සේවකයන් බඳවා ගැනීම වෙනුවෙන් පැවැති නිල උත්සවයකට එක්වෙමිනි. දේශපාලන සාහිත්‍යයේ ප්‍රභූ - නිර්ප්‍රභූ ලෙස පන්ති නැති අතර ඇත්තේ ධනපති පන්තිය - නිර්ධන පන්තිය සහ අතරමැදි පන්ති කොටස්ය. විශේෂයෙන් වැඩකරන පන්තියේ ප්‍රධානතම කොටස් දෙක වන්නේ කම්කරුවන් සහ ගොවීන්ය. පීඩිත ජන කණ්ඩායම් කෙරෙහි වත්මන් ආණ්ඩුවේ දැඩි අවධානය යොමුව ඇති බව ඇමතිවරයා පවසද්දී මහපොළොව මත සැබවින් සිදුවෙමින් පවතින්නේ කුමක්ද? ඒ ගැන විමසා බැලීමට ගොවීන්ගේ සහ කම්කරුවන්ගේ තත්වය දෙස හැරී බැලීම වැදගත් වේ.

ගොවීන් අරගල බිමට

පසුගිය මාසය අරගල බිම උණුසුම් වූ මාසයකි. ඒ රට පුරා ගොවීන් අරගල බිම ආක්‍රමණය කිරීමත් සමගිනි. ගොවීන් අරගලයට පෙළඹවූයේ විවලට ඉතාම අඩු මිලක් ලැබීමේ ප්‍රශ්නයයි. ජූනි මාසය වනවිට වී කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවනු ලැබුවේ රුපියල් 85-95 අතර මිලකි. මෙය වී කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැයට වඩා රුපියල් 15 - 20ක අඩු මුදලකි. පොද්ගලික සහල් මෝල් හිමියන් මෙතරම් අඩු මිලකට වී මිලට ගැනීමේ ප්‍රධාන හේතුව රජයේ වී ගබඩා වසා දමා රජය වී මිලට ගැනීම නතර කර තිබීමයි. අවම මිලක් සඳහා ප්‍රමිතිය සැකසීමේදී රජයේ මැදිහත්වීම තීරණාත්මක වන අතර පොද්ගලික සහල් මෝල්වලට ඒකාධිකාරය නිර්මාණය වූ පසුව ඔවුන් කුණු කොල්ලයට ගොවීන්ගේ වී තොග කොල්ල කෑම ආරම්භ කරයි. සාමාන්‍යයෙන් රජයේ වී ගබඩාවලට වී විකිණීම තරමක් අපහසු ක්‍රියාවලියකි. ගොවීන් වී තොග රජයේ ගබඩාවලටම ගෙනගොස් දිය යුතු වන අතර පොද්ගලික මෝල් ගොවි බිමටම පැමිණ අස්වැන්න මිලට ගනියි. රජය විවල තෙත් බවේ ප්‍රමිතිය මනින අතර වැසි සහිත සමයකදී එකී ප්‍රමිතියට වී වේලීම අපහසුය. නමුත් පොද්ගලික මෝල් සතුව වී වියලන යන්ත්‍ර ඇති නිසා ඔවුන්ට තෙත බර වැඩි වී වුව විකිණිය හැක. එහෙත් නිදසුනක් ලෙස රජය වී වී කිලෝ ග්‍රෑමයක් රුපියල් 120කට මිලදී ගන්නා බව ප්‍රකාශ කළ සැනින් පොද්ගලික මෝල් හිමියන් සිය මිල මට්ටම් රුපියල් 115-120 අතරට ගෙන එයි. කෙසේ වෙතත් රජය හුදු අවම මිල නිවේදනය කිරීමෙන් නොනැවතී වැඩි වී තොග යක් අත්පත් කර ගැනීම වැදගත් වන්නේ වෙළඳපොලේ සහල්වල උපරිම සිල්ලර මිල තීරණය කිරීමේදී නැවත රජය සතු ශක්තිය තීරණාත්මක වන හෙයිනි.

වත්මන් අර්බුදයේ මුලමුල පසුගිය මහ කන්නය (2025 ඔක්තෝබර් 2026 අප්‍රේල් දක්වා වන කාලය) දක්වා විහිදෙයි. පසුගිය කන්නයේ සමස්ත වී අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 27ක් පමණ වනමුත් රජය මිලට ගෙන ඇත්තේ වී මෙට්‍රික් ටොන් 60,000ක පමණ සුළු ප්‍රමාණයක් බවට ගොවි ජාතික සමුළුව චෝදනා කරයි. මෙමගින් ලබාගත හැකි සහල් ප්‍රමාණය සමස්ත රටේ පරිභෝජනය සලකන විට සතියකටවත් ප්‍රමාණවත් නැත. පසුගිය කන්නයේ ප්‍රශ්නය වූයේ වෙනදා මෙන් රජය අවම සහතික මිල ප්‍රකාශ කළ සැනින් පොද්ගලික මෝල් හිමියන් වී මිල වැඩි නොකිරීමයි. අද ගොවීන් අස්වැන්න ලැබෙන කාලයේදී වී නොවිකිණීම ගැන ගොවීන්ට චෝදනා කරන කෘෂිකර්ම ඇමති කේ. ඩී. ලාල්කාන්ත සහ නියෝජ්‍ය ඇමති නාමල් කරුණාරත්න එදා කිව්වේ වී තොග නිවෙස්වල ගබඩා කරගෙන සිටින ලෙසය. එක්කෝ වෙළඳපොලේ වී මිල වැඩිවූ පසුව ඒවා විකුණන ලෙසත් නැතිනම් රජය පසුව ඒවා මිලට ගන්නා බවත් ඔවුන් පැවසීය. නමුත් ආණ්ඩුව දැන් පවසනුයේ ගොවීන් සතුව වී නැති අතර වී ඇත්තේ ව්‍යාපාරිකයන් සතුව බවත්, උද්ඝෝෂණය කරන්නේ ව්‍යාපාරිකයන් බවත්ය. කෘෂිකර්ම නියෝජ්‍ය ඇමති නාමල් කරුණාරත්න එලෙස කියද්දී නිවාස, ඉදිකිරීම් හා ජලසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ටී. බී. සරත් පැවසුවේ උද්ඝෝෂණය කරන්නේ ගොවි නායකයන් ලෙස වෙස්වලාගත් කසිප්පු ජාවාරම්කරුවන් බවය. අරලගංවිල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ගයක් අලුත්වැඩියා කිරීමේ වැඩ ආරම්භ කිරීම වෙනුවෙන් පැවති උත්සවයකට එක්වෙමින් ඔහු "සමහර ගොවි නායකයො කියලා ඉන්න අය ඔය වෙන දූෂණ කරන අය. සමහර අය කසිප්පු පෙරනවා ගම්වල. ඉතින් ආණ්ඩුව පෙරළාගන්න ඕනෙ, ඇයි ඒ? ඒවාට සහයෝගය ගන්න ආණ්ඩුවක් හදාගන්න" යනුවෙන් පැවසීය. වී විකිණීමට නොහැකි වීම සහ වී මිල අඩුවීමටත් වඩා මේ ප්‍රකාශ නිසා ගොවීන් අතර ආණ්ඩු විරෝධය බලවත් විය.

තර්කානුකූලව බලන කල ආණ්ඩුවට මේ මොහොතේ වී ගබඩා විවෘත කර වී කිලෝ ග්‍රෑමය රුපියල් 120 බැගින් මිලට ගැනීම වාසිදායකය. දැන් ගොවීන් ළඟ ඇත්තේ වේලා, නිසි ප්‍රමිතියට අනුව සැකසූ වී තොගය. ආණ්ඩුව කියන ලෙස යල කන්නයේ අස්වැන්න කැපෙන තුරු මිලදී ගැනීම ආරම්භ කළහොත් මෙම වී තොග මිලට ගැනීමට සිදුවන්නේ වැඩි මිලකටය. ඒ මේ වනවිට නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති නිසාය. අක්කරයක් වගා කිරීමට ගිය කන්නයේ වියදම වූ රුපියල් 1,30,000 පොහොර මිල - ඉන්ධන මිල - යන්ත්‍ර සූත්‍ර කුලිය වැඩිවීම නිසා මෙම කන්නය වනවිට රුපියල් 2,00,000 දක්වා ඉහළ ගොස් ඇතැයි ගොවි ජාතික සමුළුව පවසයි. එනිසා මෙම කන්නයේ සහතික මිල වැඩි කළ යුතුව ඇත. අනෙක් අතට ගොවීන් ලෙස වෙස්වලාගෙන ව්‍යාපාරිකයන්ට වී විකිණිය නොහැක. රජයේ ගබඩාවලට වී ගන්නේ ගොවි සමිති සහාපති සහ කෘෂි නිෂ්පාදන හා පර්යේෂණ නිලධාරියා අදාළ තොග හිමියා ගොවියෙකු බව සහතික කිරීමෙන් පසුව පමණි. එමෙන්ම එක අයෙකුගෙන් මිලදී ගන්නේ වී කිලෝ ග්‍රෑම් 2000ක් පමණි. මේ තොරතුරු අනුව පෙනී යන්නේ ආණ්ඩුව නිර්ප්‍රභූ ලෙස තමන්ව හඳුන්වා දුන්නද සැබවින් පෙනී සිටින්නේ ඒකාධිකාර මෝල් හිමියන් සහ සහල් ආනයන ව්‍යාපාරිකයන් වෙනුවෙන් වන බවය.

රාජපක්ෂ න්‍යායේ පුනරාගමනය

රාජපක්ෂ ආණ්ඩුව 2011 වසරේදී පොද්ගලික අංශ කම්කරුවන්ගේ විශ්‍රාම වැටුප් අරමුදල් වන **EPF** හා **ETF** අරමුදල් කොල්ල කෑමට දරණ ලද උත්සාහය ව්‍යර්ථ කරනු ලැබුවේ කටුනායක නිදහස් වෙළඳ කලාප කම්කරුවන්ගේ අධිෂ්ඨානසහගත අරගලයක් මගිනි. එම අරගලයේදී තරුණ කම්කරුවෙකු වන රොෂේන් චානක 2011 මැයි මස 30 වැනිදා පොලිසිය වෙඩි තබා ඝාතනය කළද සටන ජයග්‍රහණය කරන තුරු කම්කරුවන් එය ඉදිරියට ගෙනයාමට සමත් විය. එම කම්කරු අරගලය අමුඅමුවේ පාවාදෙමින් ජාතික ජන බලවේග ආණ්ඩුව එකී රාජපක්ෂ ක්‍රියාමාර්ගය නැවත කරළියට ගෙන එමින් තිබෙන බවට කම්කරු අරගල මධ්‍යස්ථානය චෝදනා කරයි. සිදුව ඇත්තේ සේවක අර්ථසාධක අරමුදල(EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල(ETF) ඒකාබද්ධ කර එය රජය, සේවායෝජකයන් හා සේවකයන්ගේ වෘත්තීය සමිති නියෝජනය කරන ත්‍රෛපාර්ශ්වික ව්‍යුහයකින් කළමනාකරණය කිරීම ගැන සලකා බැලීමට තීරණය කිරීමයි. පසුගිය ජූනි 15 වැනිදා පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳ කමිටුවක් පත්කිරීමට අනුමැතිය ලැබිණි. මෙහි සැබෑ වුවමනාව වන්නේ ලංකාව තුළ ඇති විශාලම අරමුදලේ (එහි වර්තමාන අගය රුපියල් ට්‍රිලියන 4.9ක් හෙවත් රුපියල් කෝටියේ ඒවා ලක්ෂ පහක් පමණ වේ) මුදල් ධනපතියන්ගේ උවමනාවට රිසි පරිදි ආයෝජනය කරන්නට ඉඩ හසර පාදා ගැනීමයි.

පෞද්ගලික අංශ සේවකයන්ට ඇති විශ්‍රාමික ඉතුරුම් අරමුදල වන අර්ථසාධක අරමුදල නිර්මාණය වන්නේ සේවකයාගේ මාසික වැටුපෙන් 8%ක දායක කරගෙන එය සමග සේවායෝජකයාගෙන් එම සේවකයාගේ මාසික වැටුපෙන් 12% කට සමාන මුදලක් ලබාගෙන ගිණුම්ගත කිරීමෙනි. සේවක භාරකාර අරමුදල සාජෝක්ෂව කුඩා අරමුදලක් වන අතර මේ වනවිට එහි වටිනාකම රුපියල් බිලියන 637.5කි. ආණ්ඩුවේ යෝජනාවේ මෙම අරමුදල් දෙක ඒකාබද්ධ කිරීමේ කොටසක් තිබුණද එය කිසිසේත්ම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි ක්‍රියාවකි. සාමාන්‍යයෙන් අර්ථසාධක අරමුදලට අදාළ ප්‍රතිලාභය ලබාගත හැක්කේ කම්කරුවාගේ විශ්‍රාම වයස සම්පූර්ණ වීමෙන් පසුව වුවත් භාරකාර අරමුදලේ ඉතුරුම් මුදල සෑම වසර 5ක් අවසානයේදීම ලබාගත හැක. මෙම අරමුදල්වල ක්‍රියාකාරීත්වයේ කිසිම පොදු සාධකයක් දක්නට නොහැකිමුත් ජාවාරම්කාර ව්‍යාපාරිකයන්ට ඕනෑම මහජන අරමුදලක් සිය ලාභ අරමුණුවලට භාවිතා කිරීමේ පොදු බව මෙහිදී ද සැලකිය හැක.

දැනට මෙම අරමුදල් පාලනය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේය. මහ බැංකුව මෙම අරමුදල පාලනය කිරීමේදී සිය බලය අවභාවිතා කළ අවස්ථා ඕනෑ තරම් තිබේ. රජය බැඳුම්කර හරහා අරමුදලෙන් ණය ලබා ගනිද්දී පොලිය අඩුකර කම්කරුවන්ට අසාධාරණයක් කිරීම එක නිදසුනකි. අවදානම් සහගත කොටස් මිලදී ගැනීම් නිසා අරමුදලට සිදුවූ පාඩුව තවත් නිදසුනකි. මේ පිළිබඳ විසඳුමක් සොයන්නේ නම් සිදුකළ යුතුව තිබෙන්නේ කම්කරුවන්ගේ මුදල් පිළිබඳ මැදිහත්වීමේ අයිතිය කම්කරුවන් නියෝජනය කරන සංවිධානවලට ලබාදීමයි. අර්ථසාධක අරමුදල වෘත්තීය සමිති හා කම්කරු සංවිධානවල සෘජු අධීක්ෂණය හරහා මෙහෙයවීමයි. ඒ වෙනුවට ආණ්ඩුව උත්සාහ කරන්නේ ව්‍යාපාරික ධනවතුන්ට රිසි ලෙස අර්ථසාධක අරමුදල හරහා තමන්ගේ මූල්‍ය හැකියාව ප්‍රසාරණය කරගන්නට අවකාශ සැලසීම සඳහා අරමුදලේ කළමනාකරණයට ධනපතියන් සම්බන්ධ කිරීමටය. ආණ්ඩුවේ මෙම කැබිනට් තීරණය දක්නින විට පෙනී යන්නේ ආණ්ඩුව කියන නිර්ප්‍රභූ වර්ගීකරණයට ගොවීන් පමණක් නොව කම්කරුවන්ද අයත් නොවන බවය.

මේ දිනවල වී ගොවියන් පාරට බැහැලා ආණ්ඩුවට බලපෑම් කරනවා ගබඩා ඇරලා සහතික මිලට වී මිල දී ගන්න කියලා. ඊට අමතරව පොහොර හිඟය හා පොහොර මිල අධිකවීම, වී නිෂ්පාදනයේ පිරිවැය ඉහළයාම ගැන ද හඬ නගනවා. ආණ්ඩුව මෙම ගැටලුවලට ඉක්මන් විසඳුමක් ලබා නොදුන්න හොත් ආණ්ඩුව ගෙදර යවන බවට ද තර්ජනය කරනවා.

2026 යල අස්වැන්න ද මේ වන විට කැපෙමින් පවතින අතර ආණ්ඩුවට මෙම කන්නයේ වී අස්වැන්න හා පසු ගිය මහ කන්නයේ අස්වැන්නෙන් ගොවීන් ගබඩා කර ගත් වී තොගය මිල දී ගැනීමට කෙටි කාලීන වැඩපිළිවෙළකට යාමේ දුෂ්කරතා ද මේ මොහොතේ උද්ගත ව පවතිනවා.

2025/26 මහ කන්නයේ ඇස්තමේන්තු අස්වැන්න වන වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 28 න් ආණ්ඩුව මිල දී ගතේ මෙට්‍රික් ටොන් 61000 යි. කලින් වර්ෂවල මිල දී ගත් වී ප්‍රමාණයන් සමග මේ වන විට ආණ්ඩුවේ ගබඩාවල වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 02ක් පමණ තියෙන බව කියවෙනවා. ආණ්ඩුවට ගබඩා කළ හැකි උපරිම ධාරිතාව වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 2 1/2 යි. මෙවර වී වගා කර ඇති හෙක්ටයාර් ලක්ෂ 4 1/2 ක දළ අස්වැන්න වී කිලෝ මෙට්‍රික් ටොන් ලක්ෂ 18ක් පමණ ලැබුණ හොත් පෞද්ගලික අංශය සුපුරුදු පරදී කුණු කොල්ලයට වී මිල දී ගැනීම අනිවාර්යය බැවින් ජූලි මස අවසන් වන විට මෙම අර්බුදය තව දෙතුන් ගුණයකින් වර්ධනය වීම කිසි ලෙසකින්වත් ආණ්ඩුවට වැළැක්විය හැකි වන්නේ නැහැ.

පසු ගිය අප්‍රේල් මාසයේදී කෘෂිකර්ම ඇමැතිවරයා හා වෙළෙඳ ඇමැතිවරයා විසින් ඉදිරි පත් කළ ඒකාබද්ධ කැබිනට් සංදේශය හරහා සීමාවකින් තොරව කිරි සම්බාවලට ආදේශකයක් ලෙස පොන්නි සම්බා ආනයනය කිරීමට ඉඩ දුන්නා. ඒ නිසා නාඩු වී සඳහා ඉල්ලුම අඩු වීමෙන් නාඩු සහල් ඔවුන් ලඟඇති බවට එක්සත් සහල් නිෂ්පාදකයින්ගේ සංගමය ආණ්ඩුවට චෝදනා කරනවා. ඒ සංගමය වැඩි දුරටත් ප්‍රකාශ කරන්නේ ලංකාවේ වාර්ෂික වී සම්බා පරිමෝදනය කිලෝ ග්‍රෑම් කෝටි 20 ක් බවයි. පසු ගිය අප්‍රේල් හා මැයි මාස දෙකේ පමණක් පොන්නි සම්බා කිලෝ ග්‍රෑම් කෝටි 15ක් ආනයනය කර තියෙනවා. ඒ නිසා වෙළෙඳපොළේ පොන්නි සම්බා ගොඩ ගැසී තිබෙනවා. එම සම්බා සහල් කිලෝවක් රුපියල් 230 කට වෙළඳපොළෙන් මිල දී ගැනීමේ හැකියාව ඇති බවත්, මේ නිසා නාඩු සහල් ඉල්ලුම අඩු වෙලා නාඩු වී කිලෝවක මිල රුපියල් 85 හා 95 දක්වා පහළ ගියා. ඒ වගේම ආණ්ඩුව මේ ගනු දෙනුවේ දී හාල් කිලෝවකින් රුපියල් 65 බැගින් රුපියල් බිලියන 10 ක බදු ආදායමක් ද උපයා ගෙන තියෙනවා. ඒ නිසා මෙම විවෙචනයෙන්, අර්බුදයේ වගකීමෙන්, කිසිසේත් ආණ්ඩුවට ගැලවීමක් නැහැ.

රුපියල් 18500ක් වැනි අධික මිලක් පොහොර බැගයක් සඳහා ගොවියාට ගෙවීමට සිදු වී ඇත්තේ ද ආණ්ඩුවේ වරදිනි. එය පසු ගිය මාර්තු 20 කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශයෙන් පැහැදිලි වෙනවා. "ගොවීන් එක පොහොර ඇටයක්වත් වැඩි මිලට මිලදී නොගත යුතුයි. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව හරහා රුපියල් 10200ට ආණ්ඩුවට පොහොර ලබාදෙන්න පුළුවන්" එය සත්‍යයක් මේ වසරේ මාර්තු පළමු වන දා වන විට පොහොර මෙට්‍රික් ටොන් 101000ක් රට තුළ පැවති බවට පොහොර ලේකම් කාර්යාලය ප්‍රකාශ කර තිබුණා. සියලු වගාවන් සඳහා මෙම වසරේ මෙරට පොහොර අවශ්‍යතාව පැවැතුනේ මෙට්‍රික් ටොන් 125000ක් පමණකි. ඉතිරිය අප්‍රේල් අවසන් වන විට ආනයනය කිරීමට ද සැලසුම් කර තිබුණා. 2024/25 මහ කන්නයේ වී මිල දී ගැනීමට ආණ්ඩුවට සැලස්මක් තිබුණේ නැති අතර ආණ්ඩුව ඉන් ලිස්සා ගියේ ඒ සඳහා වැඩපිළිවෙළක් හැදීමට කල් නොතිබුණ බව පවසමින්. 2025 යළි විවල සහතික මිල වැඩි කළ අතර සහතික මිල ඉක්මවා පෞද්ගලික අංශය වී මිල දී ගත්තා. එතෙක් උද්දාමයට පත් ආණ්ඩුව ඉතිහාසයේ වැඩි ම මිලක් විවලට ලබාදීම ගැන වහසි බස් දෙඩේව්වා. 2025 වසර ඒ අයුරින් ගෙවා දැමූ ආණ්ඩුව 2025/26 මහ කන්නයේ දී වී මිල වැඩි වන බවත් ඒ නිසා හැකි අයුරින් වී ගබඩා කර තබා ගන්නා ලෙස ගොවීන්ට නිල නොවන ලෙස උපදෙස් දුන්නා. මේ වන විට ආණ්ඩුවට කන්න හතරක වයසක් ගෙවී ගොස් අතත්, අනෙකුත් ක්ෂේත්‍ර මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ද ගොවියාට ද වාසි ගෙන දෙන වැඩපිළිවෙළක් ආණ්ඩුවට නොමැති බව පැහැදිලියි.

මෙම තත්වය ආණ්ඩුවට එරෙහිව මේ මොහොතේ සටන් කරන ගොවි බලවේගය විසින් නිසි පරිදි තක්සේරු කර ගත යුතුයි. එසේ නොවුණ හොත් බලවේගයන්ට සාජෝක්ෂ ජයග්‍රහණයක් අත්පත් කර ගැනීමේ අවස්ථාව අහිමි වනු ඇත.

සටන් කරන ගොවි බලවේගයේ ඉල්ලීම් අතර "ආණ්ඩුව ගෙදර යනු" යන්න කැපී පෙනුනත්, පොදු ආර්ථික සටන් පාඩ ද ඒ අතර තිබීම විසින් සමස්ත අර්බුදය ස්පර්ශ කිරීම මෙම අරගලයේ සාධනීය ලක්ෂණයක් ලෙස දැකිය හැක ය. ගොවි බලවේගයේ නිෂ්පාදන ස්වභාවය විසින් එයට අත්පත් කර දී ඇති සාංඝිද්ධිකතාව එනම් අස්වැනු නෙලන සමයේ 'අස්වැන්නට සාධාරණ මිලක් ලබා දෙනු, හා පොහෝර අවශ්‍ය මොහෝතේ නිසි කලට පොහෝර ලබා දෙනු ලෙස ඉල්ලීම් ඉදිරි පත් කර සටන් කරන අතර ඒවාට විසඳුම් ලැබුණත්, නො ලැබුණත්, කෙසේ හෝ ඒවාට මුහුණ දෙමින් ඊළග කන්නයේ ද සියලු දුෂ්කරතා විඳිමින් නිෂ්පාදන කටයුතු අරඹීම සිදුවෙනවා.

නමුත් මෙම අරගල තත්වය ඊට තරමක් වෙනස්ව නව තත්වයක් යටතේ පැන නැගුණකි. ආණ්ඩුවට හෝ පොද්ගලික අංශයට හෝ ගොවියාට යම් හෝ සාධාරණත්වයක් කෙටි කාලීනව හෝ අත්පත් කරදීමේ හැකියාවක් පවතින ව්‍යුහයේ යම් වෙනසක් නො කොට සිදු කිරීමේ හැකියාවක් නොමැති වීමත්, ගොවීන්ට ද පෙර කන්නයේ අස්වනු මෙන් ම මෙම කන්නයේ අස්වනු ද විකුණා ගැනීමට නො හැකි වීමේ අර්බුදය විසින් අඛණ්ඩ අරගලයක් මිස වෙනත් විකල්පයක් ඉතිරි නොවනු ඇත. මෙම තත්වය කළමනාකරණය කර ගනිමින් ගොවීන්ට සාධාරණ විසඳුමක් අත්පත් කර ගැනීම ද අභියෝගයකි.

නව ලිබරල් ධනවාදය හිස් මුදුණින් පිළිගන්නා හා IMF කොන්දේසි නම් උගුලේ ස්වයං හිරකරුවෙකු වී සිටින ජාතික ජන බලවේග ආණ්ඩුවට යම් හෝ ව්‍යුහාත්මක වෙනසකට යාමට කිසි සේත් ම ඉඩක් නැත. දුම්නේද හුලංග මුවලා ඇතුළු නව ලිබරල් ධනවාදයේ පොල්මක්කාර උරුමකරුවන් ද ඒ සඳහා කිසිසේත් ඉඩ නොතබනු ඇත. නමුත් මෙම තත්වය ගොවි බලවේගය විසින් කොපමණ දුරට අවබෝධ කර ගෙන සිටී ද යන්න ගැටලුවකි.

කෙසේ වෙතත් ගොවි බලවේග සමග මෙම තත්වය සාකච්ඡා කිරීම, ඔවුන්ට මෙය අවබෝධ කර දීම අනිවාර්යයකි. අවසානයේ මෙම අර්බුදයෙන් ගොඩ ඒමේ මග වැටී ඇත්තේ හුදු ආණ්ඩු මාරුවක් හරහා නොවන බවත්, පවත්නා ව්‍යුහයේ වෙනසක් සඳහා කරන ප්‍රායෝගික අභ්‍යාසයක් හරහා හැර අන් මගක් නොමැති බව ප්‍රත්‍යක්ෂ කර ගත යුතුය. ඒ සඳහා ගොවි බලවේගය වී නිෂ්පාදනයෙන් එහා යන සහල් නිෂ්පාදකයා බවට පරිවර්තනය වී මේ අභියෝගය භාර ගත යුතුය. ඒ සඳහා හෝද හෝද මඩේ දැමූ සම්ප්‍රදායික ආණ්ඩු මාරුව වෙනුවට ගොවි ජන බලවේවල සැබෑ බලයක් ගොඩනැගිය යුතු නොවේද?

හෝද හෝද මඩේ දානවා ද? ගොවි බලයක් ගොඩ නගනවා ද?

වෙළඳ පොළේ පොන්නි සම්බා ගොඩ ගැසී ඇති බවත්, ඒවා කිලෝවක් රුපියල් 230 කට වෙළඳපොළෙන් මිල දී ගැනීමේ හැකියාව ඇති බවත්, මේ නිසා නාඩු සහල් ඉල්ලුම අඩු වී ඇති බවත්, එය නාඩු වී මිල රුපියල් 85 හා 95 දක්වා පහළ යාමට හේතු වී ඇති බවය. ඒ මෙන්ම ආණ්ඩුව මෙම ගනු දෙනුවෙ දී හාල් කිලෝවකින් රුපියල් 65 බැගින් රුපියල් බිලියන 10 ක බදු ආදායමක් ද උපයා ගෙන ඇති බවත් ය. ඒ නිසා මෙම විවෙචනයෙන්, අර්බුදයේ වගකීමෙන්, කිසි සෙත් ආණ්ඩුවට ගැලවීමට නොහැකි වනු ඇත.

රුපියල් 18500ක් වැනි අධික මිලක් පොහොර සඳහා ගොවියාට ගෙවීමට සිදු වී ඇත්තේ ද ආණ්ඩුවේ වරදිනි. එය පසු ගිය මාර්තු 20 කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශයෙන් පැහැදිලි වෙනවා.

රාජ්‍ය ත්‍රස්තය පවත්වාගැනීමට මාලිමාවෙ නීති ඉක්මන්වන ලකුණු

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බවට මැතිවරණ වේදිකා ගානේ පොරොන්දු දුන් ජාතික ජනබලවේගයේ නායකයන්ම එම පැරණි පනතේ ඇතැම් බලතල වෙනත් ආකාරයෙන් පවත්වා ගෙන යන්නට උත්සාහ කරනු පෙනෙන්නට තිබේ. ඔවුන් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරන බවටද ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කර ඇත. කෙසේවුවද පාර්ලිමේන්තුවේදී ජනාධිපතිවරයා කියූ නව පනත ජනතාව තවමත් දැක නැත. ජනතාවට එවැන්නක් ගැන ඇති අවබෝධය වන්නේ පෙබරවාරියේ ඉදිරිපත් කළ 'ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කරගැනීමේ' පනත් කෙටුම්පතය. ජනාධිපතිවරයා පවසන්නේ එම කෙටුම්පත නීතියක් බවට සම්මත කරගන්නා බවදැයි නිශ්චිත නැත. නමුත් වෙනත් යෝජනාවක් ඉදිරිපත් කර නැති තත්යක් යටතේ පිළිගන්නට සිදුවන්නේ අප හමුවේ තබා ඇති කෙටුම්පත පමණය. එම කෙටුම්පත තුළ ඇත්තේ කුමක්දැයි විමසා බලමු.

අධිකරණ නියෝගයකින් තොර ව පුද්ගලයන් රඳවා තබා ගැනීම, සංවිධාන තහනම් කිරීම මෙම නව පනතින් සිදුකළ හැකිය. ඇතැම් ක්‍රියාකාරකම් 'රාජ්‍ය ආරක්ෂාවට තර්ජන' ලෙස පුළුල් ව අර්ථ දැක්වීමෙන් අනාගතයේදී දේශපාලන විරුද්ධවාදීන් සහ සිවිල් ක්‍රියාකාරිකයන් මර්දනය කිරීමට හැකි තත්වයක් නව පනතින් ගෙන එනු ඇත.

මෙම කෙටුම්පතේ එන, 'ත්‍රස්තවාදයට සහාය දීම', 'රාජ්‍ය ආරක්ෂාවට හානිකර තොරතුරු' සහ 'ජාතික ආරක්ෂාවට බලපාන ක්‍රියා' වැනි යෙදුම් පැහැදිලි සීමා නොමැති ව භාවිත කළ හැකිය. එනිසා විරෝධතා, වෘත්තීය සමිති ක්‍රියාකාරකම්, මාධ්‍ය වාර්තා සහ දේශපාලන විවේචන පවා මෙම නව පනතින් මර්දනයට ලක්කළ හැකිය.

මාධ්‍යවේදීන්ගේ සහ නීතිඥයන්ගේ වෘත්තීය රහස්‍යභාවයට ඇති කෙරෙන බලපෑම නව පනතේ එන බරපතළ තත්වයකි. එම නව නීති යටතේ තොරතුරු වාර්තා කිරීම නොසලකා හැරීම හෝ සන්නිවේදන තොරතුරු ආදිය සඟවා තබා ගැනීම හෝ අපරාධයක් ලෙස වර්ගීකරණය කළ හැකිය. එය මාධ්‍යවේදීන්, නීතිඥයන් සහ වෛද්‍යවරුන් වැනි වෘත්තීය කණ්ඩායම්වලට නීතිමය ගැටලු මතු කළ හැකි තත්වයකි.

ඩිජිටල් නිදහස සහ පුද්ගලිකත්වය උල්ලංඝනය කිරීමද මෙයින් සිදු වේ. හමුදාවට සහ පොලිසියට ලබා දී ඇති විමර්ශන පිළිබඳ සංකේතාත්මක සන්නිවේදනය සම්බන්ධ විධිවිධාන, ජංගම උපාංග සහ පරිගණකවල පෞද්ගලික දත්තවල ආරක්ෂාවට බලපාන අන්දමට මේ බලතල අනිසි ලෙස භාවිත කිරීමේ අවදානමක් ඇත.

පනත් කෙටුම්පතේ 10 වැනි පරිච්ඡේදයේ විවිධ නියම මගින් තහනම් කිරීමේ නියෝග නිකුත් කිරීමට ජනාධිපතිවරයාට අසීමිත බලතල හිමි වේ. මේ අනුව 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' අවලංගු කර නව නීති මාලාවක් හඳුන්වාදීමට දරන උත්සාහය තුළ 'ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ' ලේබලයෙන් එන මේ පනත් කෙටුම්පතට විරෝධය දැක්විය යුතුය.

මෙම කෙටුම්පත අනුව, 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත'ට වඩා මෙම නව නීතිය දරුණු ලෙස ජනතාවට බලපාන ආකාරය කරුණු ගණනාවක් ඔස්සේ පෙළ ගැස්විය හැකිය.

විදේශ රජයන්ට හෝ ජාත්‍යන්තර සංවිධානවලට එරෙහිව මෙරට ජනතාවගේ සාමකාමී විරෝධතා, ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත යටතේ තවදුරටත් නීත්‍යානුකූල විරෝධතා නොවනු ඇත. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත, ලංකා රජය පමණක් නොව " වෙනත් ඕනෑම රජයක් හෝ ජාත්‍යන්තර සංවිධානයක්" ආරක්ෂා කිරීමට බලගන්වා ඇති අතරම, ලංකාවේ ජනතාව ඇතැම් ක්‍රියාමාර්ගවලට සම්බන්ධ වීම නීති විරෝධී බවට පත් කරයි, උදාහරණ ලෙස;

චීනය, ඇමරිකා එක්සත් ජනපදය හෝ ඉන්දියාව වැනි බලසම්පන්න රාජ්‍යයන් විසින් ලංකාවට අහිතකර පාරිසරික බලපෑම් ඇති කරමින් පරිසර දූෂණයන් අඛණ්ඩව පවත්වා ගෙන යනවිට ඊට එරෙහිව විරෝධතා දැක්වීම හෝ බලකිරීම හෝ පෙත්වාදීම හෝ මෙම පනතින් දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කරයි.

එපමණක් නොව, ලංකාවේ ජීවන වියදමට අහිතකර ලෙස බලපාන බලවත් රටවල් විසින් ශ්‍රී ලංකාවට අහිතකර ලෙස පනවා ඇති අත්තනෝමතික තීරුබදුවලට එරෙහිව විරෝධතා දැක්වීම ත්‍රස්තවාදී ක්‍රියා ලෙස සලකනු ඇත.

ලංකාකයන් විසින් සිදු කරනු ලබන එවැනි විරෝධතා, ත්‍රස්තවාදී ක්‍රියා ලෙස සලකනු ලබන බව ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් වේ. මෙබඳු ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපාදන මෙරට මේ තරම් මර්දනයකට යොදාගන්නා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ පවා අඩංගු නොවේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ගොනු කොට විභාග කෙරුණු පූර්වාදර්ශමය නඩු ගණනාවකදී අභියාචනාධිකරණය තීන්දු කර ඇත්තේ, වසරක් රිමාන්ඩ් භාරයේ තබා ගැනීම හෝ නඩු විභාගයකින් තොරව රඳවා තබා ගැනීම පවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (4) වගන්තියේ ව්‍යතිරේකයට යටත්ව, දඬුවමක් බවයි. ත්‍රස්තවාදී චෝදනා යටතේ රඳවා තැබීමේදී දෙමසක් වැනි දීර්ඝ කාලයක් එකවර රැඳවුම් භාරයේ එනම් බන්ධනාගාර භාරයට පත් නොකර වධ හිංසා පමුණුවමින් තබා ගැනීමේ අවස්ථාව තිබේ. එහෙත් එහිදී රැඳවුම් කාලය තවදුරටත් දීර්ඝ කරමින් උපරිම දින 90ක් රඳවා ගැනීමට නීතිමය ප්‍රතිපාදන තිබුණි. එවන් අවස්ථාවල රැඳවියා මසකට වරක් මහෙස්ත්‍රාත්වරයා හමුවට පැමිණවිය යුතු විය. පසුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට 2022 අංක 12 දරණ සංශෝධනය මගින් පළමුවරට රඳවා ගැනීමේ කාලය තුන් මසක් දක්වා දීර්ඝ කළ අතර රඳවා තබාගැනීමේ කාලය වසරක් දක්වා දිගු කෙරිණි. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත යටතේ රක්ෂිත බන්ධනාගාරගත කරන කාලය හෝ රඳවා ගැනීමේ කාලය අවම වශයෙන් වසර 02 දක්වා දීර්ඝ කර ඇත. මෙම ආකාරයට අධිකරණ ක්‍රියාවලියේදී ඇප ලබාදීමට ඇති වසර දෙකක කාලය පවා, විධායක නිලධාරියා වන ආරක්ෂක ලේකම්වරයාගේ රැඳවුම් නියෝගයක් මගින් අහිමි කළ හැකිය.

මෙම නව පනතෙන් ත්‍රස්තවාදයට එරෙහි ලෙස ගෙන එන වගන්ති යටතේ ජනමාධ්‍ය පවා අධිපතිවාදී ලෙස පාලනය කළ හැකිය. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය, අන්තර්ජාලය, වීඩියෝ පටිගත කිරීම සහ පෞද්ගලික ලිපි සහ සමාජ මාධ්‍ය ඇතුළු ඕනෑම තැනක ඇති ලේඛන, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනතෙ හි ත්‍රස්තවාදී ප්‍රකාශන ලෙස විස්තර කළ හැකි අතර, එය ත්‍රස්තවාදී ජාල අධීක්ෂණය යටතට ගෙනැවිත් ඇත. මෙම තත්වයන් තුළ කිසියම් පුද්ගලයෙක් වරදකරු කළහොත් උපරිම වශයෙන් වසර 15ක සිර දඬුවමක් සහ, හෝ රුපියල් මිලියන 15ක දඩයක් නියම කළ හැකිය.

ත්‍රස්තවාදයට අදාළ විමර්ශන හෝ ප්‍රවෘත්ති ප්‍රකාශයට පත් කිරීම තහනම් කිරීමේ විධිවිධානයක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ද තිබුණි. ඒ අනුව වරදකරු කළ හොත්, උපරිම සිර දඬුවම වසර පහකි. නමුත් මෙය 2022 අංක 12 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය මගින් අහෝසි කරන ලදී. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වඩා දරුණු තත්වයක් ඇති කරයි. එය, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතෙහි ජනතාවගේ ප්‍රකාශන නිදහසට පහර දීම සඳහා වේදිකාවක් ලෙස භාවිත කරන අවස්ථා කිහිපයෙන් එකකි.

මෙම පනත් කෙටුම්පත අනුව, මේ

අධිකරණ නියෝගයකින් තොරව පුද්ගලයන් රඳවා තබා ගැනීම, සංවිධාන තහනම් කිරීම මෙම නව පනතින් සිදුකළ හැකිය. ඇතැම් ක්‍රියාකාරකම් 'රාජ්‍ය ආරක්ෂාවට තර්ජන' ලෙස පුළුල් ව අර්ථ දැක්වීමෙන් අනාගතයේදී දේශපාලන විරුද්ධවාදීන් සහ සිවිල් ක්‍රියාකාරිකයන් මර්දනය කිරීමට හැකි තත්වයක් නව පනතින් ගෙන එනු ඇත.

රටේ විධායකය අධිකරණ බලයට ඉහළින් සිටී; සැකකරුවන් සඳහා ආරක්ෂක ලේකම්වරයාගේ රඳවා ගැනීමේ නියෝග, මහෙස්ත්‍රාත්වරුන්ට හෝ මහාධිකරණ විනිසුරුවරුන්ට අවලංගු කළ නොහැක. ආරක්ෂක ලේකම්වරයාට (මීට පෙර ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කරන ලදී) සහ පොලිස්අධිකාරීවරුන්ට සැකකරුවන් රඳවා තබා ගැනීමට පැවරී ඇති බලය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම වෙනුවට සහ මහෙස්ත්‍රාත්වරුන්ට අධිකරණය තුළ බලය පැවරීම වෙනුවට, අමාත්‍යාංශ ලේකම්වරයකුට සැකකරුවන්ට සවන් නොදී විෂයයන්ගේ නිදහස අහිමි කරමින් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත යටතේ රැඳවුම් නියෝග නිකුත් කළ හැකි අතර, මෙය ඇප හෝ රිමාන්ඩ් සලකා බැලීම සඳහා මහෙස්ත්‍රාත්වරුන් සහ මහාධිකරණ විනිසුරුවරුන් විවෘත අධිකරණයේ දී සියලු පාර්ශ්වයන්ට සවන් දුන් පෙර පැවති ක්‍රමයට වඩා වෙනස්ය.

ආරක්ෂක අමාත්‍යංශ ලේකම් විසින් නිකුත් කළ රඳවා තබාගැනීමේ නියෝග නඩු විභාගය අවසන් වන තෙක් වලංගුය. නීති කෙටුම්පතේ 58 වන වගන්තිය මගින් ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයා හරහා විධායකයට සැකකරුවකු අත්අඩංගුවට ගත් දින සිට නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තබාගැනීමට හැකියාව ලබාදෙයි. සැකකරුවකු ලෙස අත්අඩංගුවට ගත් අයකු වරදකරු බවට පත් වන තෙක් නිර්දෝෂීභාවය සැලකීම සම්බන්ධයෙන් නීති ක්ෂේත්‍රයේ පවතින සම්මුතිය, එමගින් සමච්චලයට ලක් කරයි. එසේම ඕනෑම පුද්ගලයකු සැකකරුවකු කළ විට මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම පිළිගන්නා සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය එහිදී අහිමි කරයි.

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත යටතේ අධිකරණ භාරයේ පසුවන සැකකරුවකු බන්ධනාගාර අධීක්ෂණයකින් තොරව නැවත පොලිස්භාරයට ගැනීමට විමර්ශනය සිදුකරන පොලිසියට බලය පවරයි. මෙය අතිශය බරපතළ තත්වයකි. පනත් කෙටුම්පතේ 58 (2) වගන්තිය මගින් සැකකරුවකු රක්ෂිත බන්ධනාගාරයෙන් ඉවත් කිරීමට සහ බන්ධනාගාර නිලධාරීන් නොමැතිව සැකකරු පොලිස්භාරයේ තබාග නීමට නිලධාරයන් සඳහා අවසර දීම සඳහා වේදිකාවක් ලෙස භාවිත කරන අවස්ථා කිහිපයෙන් එකකි.

මෙම පනත් කෙටුම්පත අනුව, මේ එවැනි විධිවිධාන නැත. මෙම විධිවිධානය මගින් සැකකරුවන් අත්අඩංගුවේ සිටිය දී වධහිංසා පැමිණවීම පිළිබඳව පැමිණිලි කිරීමට පවා බියක් ඇති කරනු ඇත.

මේ නිසා මෙම පනත් කෙටුම්පත හුදෙක් ත්‍රස්තවාදය වැළැක්වීමට හෝ රාජ්‍ය ආරක්ෂා කිරීමට නොව, සමාජයීය සාමාන්‍ය ජීවිතය පවා තර්ජනයට ලක් කරවන නීති ගෙන එන්නට ගන්නා උත්සාහයකි. ඒ සම්බන්ධයෙන් වඩාත් සනාථ කෙරෙන කරුණු මේ පනත් කෙටුම්පත ඔස්සේ හඳුනාගත හැකිය.

කිසිදු නිසි ක්‍රියා පටිපාටියකින් තොරව ජනාධිපතිවරයාට, සිවිල් සමාජ සංවිධාන, වෙළෙඳ සංගම්, දේශපාලන පක්ෂ සහ ආගමික සංවිධාන තහනම් කළ හැකිය. මෙම පනත යටතේ වරදක් වන ඕනෑම ක්‍රියාවක නියැලී සිටින බවට ජනාධිපතිවරයාට කිව හැකි හේතු ඇතිවිට එවැනි පියවරක් ගතහැකිය. ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක ජාතික ආරක්ෂාවට නීති විරෝධී ලෙස අගතිගාමී ලෙස කටයුතු කරන්නේ යැයි චෝදනා නගමින්, අධිකරණ මැදිහත්වීමකින් තොරව, නිසි ක්‍රියා පටිපාටියකින් තොරව, විමර්ශනයකින් හෝ අවම වශයෙන් හේතු දැක්වීමේ දැන්වීමකින් තොරව ඕනෑම සංවිධානයක් තහනම් කිරීමට ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත ජනාධිපතිවරයාට බලය පවරයි. මෙවැනි බරපතළ කාරණයකදී තහනම නියෝග පැනවීම හුදෙක් ජනාධිපතිවරයාගේ විශ්වාසය මත පමණක් රඳා පවතින අතර එහිදී කිසිදු නිසි ක්‍රියා පටිපාටියක් හෝ අධිකරණයකින් වරදකරු කිරීමකින් තොරව අත්නෝමතික ලෙස කටයුතු කරන්නට ජනාධිපතිවරයාට හැකිය.

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත මගින් සිවිල් සමාජයට පැහැදිලි කිරීමට අවස්ථාවක් නොමැතිව තහනම් කරන බවට තර්ජනය කිරීමට පවා ඉතා පුළුල් බලතල ලබාදෙයි. මෙය, ජන සමාජයක් විනාශයට ඇද දැමීම නිසා අපකීර්තියට පත් අත්තනෝමතික බලයක් හිමිකර දෙන විධායක ජනාධිපති ක්‍රමයම සම්පූර්ණයෙන්ම අහෝසි කරන බවට තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වූ ජාතික ජනබලවේගය විසින් යෝජනා කිරීමම බිහිසුණු තත්වයකි. ජනාධිපතිවරයාට තවදුරටත් අත්තනෝමතික බලයක් ලබාදෙන මෙම විධිවිධානය සිවිල් සමාජ සංගම්වල නිදහසට පමණක් නොව වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ සහ ආගමික සංවිධානවලට ද බරපතළ තර්ජනයකි.

මහජන ආරක්ෂක පනත යටතේ ඇඳිරි නීති නියෝග සහ සීමා කිරීමේ නියෝග මෙන්ම සන්නද්ධ හමුදා බලගැන්වීම යනාදිය ජනාධිපතිවරයා විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන්නේ හදිසි තත්වයක් නිසි ලෙස ප්‍රකාශයට පත් කර ඇති අසාමාන්‍ය අවස්ථාවන්හිදී පමණකි. ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත යටතේ පාලකයන්ට හදිසි තීරණ ගැනීමේ බලතල ක්ෂණිකව ක්‍රියාත්මක කිරීමට බලය ලබාදෙයි. ජනතාව ආරක්ෂා කිරීමේ නාමයෙන් ජනතාවගේ නිදහසට අහිතකර ලෙස තර්ජනයක් වන අසාමාන්‍ය බලතල පවරයි. ඒවා රාජ්‍යයේ ආරක්ෂාවට අවශ්‍ය සාමාන්‍ය බලතල ලෙස ක්‍රියාත්මක කිරීමට, පාලකයන්ට හැකියාව ලබාදෙයි.

මේ කරුණු අනුව, ජාතික ජනබලවේගය ආණ්ඩුව, දැනටමත් සමාජයක් හෙළා දකින 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත'ටත් ඔබ්බට ගොස් 'ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත' ගෙනැවිත් ඇත්තේ වඩාත් අමානුෂික පාලනයක්, බිහිසුණු තත්වයක් ඇතිකරන නීතියක් ස්ථාපිත කරන්නටය.

එබැවින් දේශපාලන පක්ෂ, ප්‍රගතිශීලී සමාජ ක්‍රියාකාරිකයන් මෙන්ම සාමාන්‍ය ජනතාව ඒකාබද්ධව මේ බිහිසුණු නීතිය පරාජය කරන්නට මෙන්ම මෙවැනි නීති ගෙන එන්නට තරම් බියක් ලප්ජාවක් නැති පාලක කණ්ඩායම ජනතා බලයට යටත් කරන්නට පියවර ගත යුතුව ඇත.

ප්‍රජනෝ විදියම

වැඩිවන ජීවන වියදමට බදු බරට එරෙහිව පැවැත්වුණු උද්ඝෝෂණයෙන් පස්සේ නාඳුනන වැඩිහිටියෙක් බුදුන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී දේශනා කරපු ප්‍රකාශයක් අපට ගෙනත් පෙන්නුවා.

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථංච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති"

මේ එහි සිංහල තේරුම: "හරි හම්බ කරන දෙයින් එක් කොටසක් අනුභවය සඳහාද. දෙකොටසක් ස්වකීය කර්මාන්ත දියුණුව සඳහාද, ඉතිරි කොටස මතු දියුණුව හා අනාගතයේ ප්‍රයෝජනයට ගැනීම සඳහාද යෙදවිය යුතු වන්නේය."

මෙරට වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගෙන් 42.2 %ක්ම බහුවිධ දරිද්‍රතාවයෙන් පෙලෙන බව යුනිසෙෆ් ආයතනය ලංකාව සම්බන්ධයෙන් නිකුත් කළ නවතම වාර්තාවක සඳහන් වෙනවා. මාස පහට අඩු දරුවන්ගෙන් 125,622 (38.9%) දෙනෙක්ම උසට සරිලන බර නොමැති දරුවන් බවත් එහි දැක්වෙනවා.

සංවර්ධනය සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුවේ නායකයන් ගෙන හැර දක්වන පම්පෝරි සහගත කතා සහ මහ පොළොවේ විවර වෙමින් පවතින පැල්ම මරියානා අගාධය තරම් විශාල එකක්.

'එක්ස් (x)' කියලා ඉන්දියන් චිත්‍රපටයක් මෑතක පොද්ගලික රූපවාහිනී නාලිකාවක ප්‍රචාරය වුණා.

චිත්‍රපටය පුරා කියන්න හදන්නේ ඉන්දියාවට එරෙහිව බියකරු කුමන්ත්‍රණයන් ක්‍රියාත්මක වෙද්දී ඒවා පරාජය කිරීම සඳහා 'රෝ' සංවිධානය ක්‍රියාත්මක වන විදිහ. තමන්ගේ සංවිධානය පාවා දෙන්නන් කිසිදු සමාවකින් තොරව මරා දමන විදිහ. සිය ජීවිතය වුව දන් දී රට වෙනුවෙන් රෝ ඒජන්තයන් කටයුතු කරන්න ඕන විදිහ.

එල්ටීටීඊ සංවිධානයට ඉන්දියාවේ අවි පුහුණුව දුන් කතා කියන්නෙ ප්‍රසිද්ධ වූ රෝ ක්‍රියාකාරකම් කිහිපයක් පමණයි. තවමත් හෙළිදරව් නොවූ බිහිසුණු අප්‍රකට ක්‍රියාකාරකම් බොහෝයි.

ජාජබ ආණ්ඩුව මේ දවස්වල පෙන්වන්න හදනවා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වන පරීක්ෂණ අපක්ෂපාතිව සිදු කරන බවටත්, කිනම් බලපෑමක් මැද වුව ඒවා කිසිසේත් නතර නොකරන බවත් නමුත් ආණ්ඩු බලය ගන්න කලින් වත්මන් කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස මේ පාස්කු ප්‍රහාරය පිටිසස්සේ ඉන්න මහ මොලකරුවා ඉන්දියාව සහ 'රෝ' සංවිධානය බවට කළ ප්‍රසිද්ධ ප්‍රකාශය ගැන අද ආණ්ඩුව මොකුත් නොකියා මගහැර යනවා. 'රෝ' සංවිධානය හරහා සාරා ඉන්දියාවට අරන් ගිය විදිය ගැන පවා එදා නලින්ද ජයතිස්ස කතා කෙරුවා.

"එජාප ආණ්ඩුව ඊනියා සාම සාකච්ඡා සඳහා තල්ලු කරන්න 'රෝ' සංවිධානය සැලසුම් කරපු ක්‍රියාවලින් එකක් තමයි ශ්‍රී මහා බෝධිය ළඟ සිල් අරන් හිටපු උපාසක උපාසිකාවන් ඝාතනය කිරීම. නමුත් ප්ලොට් සංවිධානය එවැනි ක්‍රියාවන් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කෙරුවා. ඊජීආර්එල්එෆ් පවා කැමති වුනේ නෑ එවැනි ප්‍රහාරයකට. නමුත් රෝ සංවිධානයේ යෝජනාව එල්ටීටීඊ භාරගත්තා." මෙහෙම කියන්නේ කලක් ප්ලොට් සංවිධානය සමග වැඩ කරපු එහි ක්‍රියාකාරිකයන්. ඉතින් පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවෝ හොයාගෙන යන්න ඉන්දියාව ඉදිරියේ අද වන විට සම්පූර්ණයෙන් දණ ගහන් ඉන්න වත්මන් ජාජබ ආණ්ඩුවට පුළුවන් වෙයිද?

පහතින් පළවෙන්නේ ඒකාබද්ධ ගුරු සේවා සංගමයේ සහෝදරයෙකුට වෙනත් ගුරුවරයෙක් යොමු කර තිබූ ලිපියක්. එතුළින් මතු කරන කරුණු කෙරෙහි විවෘත සංවාදයක් සිදු කරන්න සුදුසු නිසා ඒ මුළු ලිපිමම දාන්න ඉඩ මදි උනත් එහි කොටසක් හෝ 'දූපතින් එළියට' තුළ පළ කරන්න අප සිතුවා.

"මම පෙරටිටෙක්ද ජෙප්පෙක්ද....

ඊයේ උසස් පෙළ ළමයින්ගේ ප්‍රගති සමාලෝචනයට සම්බන්ධ උනා. වේදිකාවට නැගපු ජනප්‍රිය බාලිකාවෙ කෙල්ලන්ගෙන් දෙතුන් දෙනෙක් විතරයි විදුහල්පතිතුමියට දන ගහලා වැන්දේ. ඒත් දෙමව්පියන් ඇඟිල්ලෙන් ඇනපු නිසා, ඒත් ඒ කිසිවක් විදුහල්පතිනියට ප්‍රශ්න වුණේ නෑ.

ඒක නෙමෙයි කතාව. විෂය උගන්වන ගුරුවරු මව්පියන් සහ දියණියන් ඇමතුවා. 'මහන්සි වෙන්න අමතර වැඩ කරන්න. ෆෝන් අයින් කරන්න. ආරක්ෂා වෙන්න. සාමූහිකව වැඩ කරන්න. අනිවාර්යෙන්ම පාසලට එන්න.'

ඒ අතර භෞතික විද්‍යාව උගන්වන ජව්පෙ සගයත් දේශනයක් කළා

'අනිවාර්යෙන් ඉස්කෝලෙ එන්න ඕන. විභාග පාස් වෙන්න උත්සාහය වගේම වාසනාව තියෙන්නත් ඕන. දෙමව්පියන් නිතරම දරුවාගේ පස්සෙන් ඉන්න. ෆෝන් එක නම් දෙන්න එපා. මමත් කළමනාකරුවෙක් විදිහට කරපු ජොබ් එක අත ඇරලා ආව කෙනෙක්. ඒ කළේ මගේ දරුවා වෙනුවෙන්..'

ඒ කතාවේදී ළමයි බිම බලාගෙන උන්නා දෙමව්පියෝ ඔහේ බලාගෙන උන්නා. අපි ඒ කාලේ ජව්පෙ වැඩ කරනකොටත් මට මතකයි 'භෞතිකවාදී' ගුරුවරයෙක්ගේ භූමිකාව පවර ගන්න කියලා අපිට බල කළා. ඒත් අද වෙනකොට ඒවා අතීතයක් විතරයි. අද අපි පාසලේ කරන වැඩවලට කොතරම් දේශපාලන ඉලක්කයක් තියෙනවද.?

ගුරු භූමිකාව නැමැති ශ්‍රීතයට මොන ක්‍රියාකාරකම් දැම්මත් ඒ ශ්‍රීතය ඇඳෙන්න ඕනේ සන්තනිකව සමාජවාදයේ හැඩයටයි."

සාපලත් කළු ජූලියේ සැඟවුණ තතු සොයායාම

ලාංකීය ඉතිහාසයට කිසිදා නොමැකිය හැකි කළු පැල්ලමක් එක්කළ ඒ කුරිරු කළු ජූලියට මේ මස 23 වෙනිදාට වසර 43 ක් සපිරේ.

කළු ජූලිය යනු සිංහල ජනතාව අතරින් ඕපපාතිකව හටගත් එකක් නොව මල කඳන් මතින් වුව බලය සඳහා පොරබදන දේශපාලකයන් විසින් සංවිධානාත්මකව සිදු කළ කුරිරු මෙහෙයුමකි.

දකුණේ සමාජය තවමත් මෙහි මූල බීජය ලෙස සලකන්නේ උතුරේදී හමුදා සෙබළුන් 13 ක් දෙනෙක් එල්.ටී.ටී.ඊ. ය විසින් මරා දැමීමත්, බොරැල්ල කනත්තට එම මළසිරුරු ගෙන එන මොහොතේදී ඇතිවූ කෝලාහලයක් ලෙසත්ය. නමුත් සත්‍යය එය නොවේ.

එල්ටීටීඊ ය උතුරේදී හමුදා සෙබළුන් 13 දෙනෙක් ඝාතනය කරනුයේ ඊට සති 2 කට පෙර චාවකච්චේරි ප්‍රදේශයේදී එල්ටීටීඊ සංවිධානයේ නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ සමීපතම මිතුරෙක් වූ චාල්ස් ලූකස් ඇන්තනි හෙවත් සීලන් ඇතුළු කිහිප දෙනෙක් හමුදාව මගින් ඝාතනය කිරීමට පළිග ැනීමක් ලෙසය.

87 /89 දකුණේ නැගී සිටීම සිදුවූ අවධියේදී හමුදා සෙබළුන් කිහිප දෙනෙක් සන්නද්ධ කණ්ඩායම් අතින් මරුමුවට පත්වන සෑම මොහොතකදීම ඒ අවට පුදේශවලින් අත්අඩංගුවට ගත් තරුණයන් විශාල පිරිසක් ඝාතනය කර දැමීම් සිදුවූ පරිද්දෙන්ම උතුරු නැගෙනහිර යුද්ධය සමයේදීත් එම ක්‍රියා මාර්ගයන් එලෙසම සිදුවිය.

හමුදා සෙබළුන් 13 දෙනෙකු මරා දැමීමත් සමඟ කුපිත වූ හමුදා භටයන් යාපනයේ අහිංසක දෙමළ ජනතාව 51 දෙනෙකු කෘෂර ලෙස ඝාතනය කොට දැමූ බව තවමත් දකුණේ බොහෝ දෙනා දන්නේ නැත. එවකට සිටි පොලිස්පති රුදා රාජසිංහම් ජනාධිපති ජේ.ආර් ජයවර්ධනට දන්වා තිබුණේ හමුදාවේ මේ හැසිරීම් තමන්ට පාලනය කළ නොහැකි බවය. ජේ.ආර්. ජයවර්ධන තමන්ගේ බැනා කෙනෙකු වූ ජෙනරාල් තිස්ස වීරතුංග උතුරට යවන්නේ එම තත්වය පාලනය කිරීමටය.

ආරක්ෂක ලේකම් ජනරාල් සේපාල ආටිගල ජෙනරාල් තිස්ස වීරතුංගගෙන් අසා තිබුණේ මෙම හමුදා සෙබළ 13 දෙනාගේ මළ සිරුරු කොළඹට නොගෙනවිත් පලාලි ගුවන් හමුදා කඳවුරේවල දැමීමට නොහැකි ද යන්නය. එවිට තිස්ස වීරතුංග ආරක්ෂක ලේකම්වරයාට පවසා තිබුණේ "හමුදාවෙ එවුන් මාවත් ඒ වලටම දාලා පස් දායි" යනුවෙනි.

දකුණ නොදන්නා මෙවන් බිහිසුණු සිදුවීම් තිස් වසරක යුද්ධය මැද අඩුවක් නොමැතිවම සිදුවිය. යාපනයේ කයිට්ස් දූපතේදී මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුවත් බ්‍රිගේඩියර් විජය විමලරත්නත් බිම් බෝම්බයකට හසුව ඝාතනය වූ දින මඩකලපුව පුනානි කඳවුර ආසන්නයේ ඇති මයිලන්තැන්න නමැති තමිල් ගම්මානයේ අහිංසක සිවිල් වැසියන් 37 දෙනෙක් කැති මන්නාවලින් කපා කොටා ඝාතනය කලේ මයිලන්තැන්න හමුදා කඳවුරේ හමුදා සෙබළුන් පිරිසක් විසිනි. පසුව ඔවුන් යුද හමුදා පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන පනාගොඩ යුද හමුදා සිර කඳවුරේ මාස කීපයක් රඳවා තබාගෙන සිට නිදහස් කර හරින ලදී. මෙවැනිම පලිගැනීම් එල්ටීටීඊ සංවිධානය මගින් ද සැලසුම් කොට ගම්මාන වලට පහර දී අහිංසක ජනතාව ඝාතනය කිරීම් ලේ වැකි යුද්ධය පුරා බොහෝ විට සිදුවිය.

හමුදා සෙබළුන් 13 දෙනාගේ මළ සිරුරු බොරැල්ල කනත්තට ගෙන ඒමට පියවර ගැනීමත් සමඟ කර්මාන්ත ඇමති සිරිල් මැතිව් ලා ක්‍රියාත්මක වන අතර. ඔවුන් එදින දහවලේ සිටම අමාත්‍යංශ වාහනවලින් තෝරාගත් පිරිස් බොරැල්ල කනත්ත වෙත එක්රැස් කිරීමට පියවර ගෙන තිබුණි. මළසිරු බොරැල්ල කනත්තට නොගෙනවිත් හමුදා මූලස්ථානයට රැගෙන යන බවට ප්‍රචාරයක් යවන්නේ රාත්‍රී දහයට පමණය. එහි රැස් කර සිටි පිරිස් අතර ජාතිවාදයේ සරණ යන භික්ෂූන් වහන්සේලා ද විශාල පොලිසිකාරී පහර දී මිය යාමටත් ප්‍රථම ඔහු පැමිණි මෝටර් රථයටම දමා ගිනි තබා මරා දැමීමය. ඔහු අධ්‍යක්ෂණය කළ සිරිපතුල චිත්‍රපටය යනු එකළ බෞද්ධ ආගමික ජනතාවගේ ඉහත් ගෞරවාදරයට භාජනය වූ චිත්‍රපටයක් විය. තමන්ට වාහනයෙන් බිමට බැසීමට අණ ලැබුණු විට තමන් 'සිරිපතුල' චිත්‍රපටය හැදූ වෙන්කට් බව මැරයන්ට පැවසුවද ඔවුන් ඒ කිසිවක් කනකට හෝ ගෙන නොතිබුණි.

අදටත් වෙසක් , පොසොන් දන්සල්වල වාදනය කරන බොහෝ බොදු බැති ගී වෙන්කට්ගේ සිරිපතුළ චිත්‍රපටයේ එන ගීත බව තවමත් බොහෝ දෙනා දන්නේ නැත.

ආර්.රොක්සාමි නැමති දක්ෂ සංගීතඥයාගේ ජීවිතය බේරා ගත හැකි වී තිබුණෙ ජොතිපාල සහ ප්‍රේමසිරි කේමදාසයන් මැදිහත්වී ඔහුව ඔවුන්ගේ නිවසකට රැගෙන ගොස් තිබූ නිසාය.

දස දහස් ගනන් ජනතාව ඉන්දියාවට පළාගියේය. තවත් ලක්ෂයකට වැඩි පිරිසක් දකුණේ නොසිට උතුරට පළා ගියේය. එල් ටී ටී ඊ සංවිධානය වටා තරුණ පිරිස් වැඩි වැඩියෙන් ඒකරාශී වීමට අදාළ උත්තේජනයන් සැපයුවේද කළු ජූලිය විසින් තමිල් ජන සමාජය පුරා ඇතිකළ ගැඹුරට කා වැදුනු තුවාල මිස අන් යමක් නොවේ. ඊට හොඳම උදාහරණය කිරුලපන පොලිසියේ සේවය කළ පොලිස් කොන්ස්තාපල් නඩේෂන්ය. ඔහුගේ පියා සම සමාජ පාක්ෂිකයෙකි. ඒ වනවිටත් ඔහු එම පොලිසියේම සේවය කළ විනීතා සමරසිංහ සමඟ ප්‍රේම සබඳතාවයක් පවත්වාගෙන යමින් සිටියේය. ඊට ඇයගේ ගෙදරින් එල්ල වූයේ දැඩි විරෝධයකි. කළු ජූලියට හසුවූ පොලිස් කොන්ස්තාපල් නඩේෂන්ට තමන් සිටි නිවස පවා අහිමි වූ විට ඔහු කළේ කලකිරීම් මැදම සිය පෙම්වතියද කැටුවා පොලිස් සේවයට ආයුබෝවන් කියා ඇයත් සමඟම වැල්වැටිතුරේට පළා යාමය. 2009 මැයි 18 වැනිදා අවාසනාවන්තම සිදුවීමක් වූයේ සිරිපතුල, මහ රෑ හමුවූ ස්ත්‍රිය, අද මෙහෙමයි, දමයන්ති, නිලූකා, මගෙ අම්මා ආදී චිත්‍රපට රැසක් අධ්‍යක්ෂණය කළ ජේ.ආර්. වෙන්කට්ට නැමති තමිල් සිනමාකරුවා සිය නැගනියට කරදරයක් බවට ලද ආරංචියකින් සසල වී දෙහිවල නගරයට පැමිණෙමින් සිටියදී සිංහල ජාතිවාදීන් පිරිසකට හසුව හිසට යකඩ පොල්කඩින් පහර දී මිය යාමත් සමඟ ඔහු මියගියේ එල්ටීටීඊ සංවිධානයේ පොලිස්පති ලෙසය.

වාමාංශික දේශපාලන පක්ෂ කිහිපයක්ම පසුව තහනම් කිරීමට ජේ.ආර්. ජයවර්ධන කටයුතු කළේ උන්ම නිර්මාණය කළ කළු ජූලියට එකි දේශපාලන පක්ෂ සම්බන්ධ බවට චෝදනා නගමිනි.

කළු ජූලියට වසර 43 ක් සපිරෙන අද දවසේ ඉන් ඇතිකළ ගැඹුරු තුවාල යළි නොපාරමින් හා එවන් වාසනයක් යළි කිසිදා මේ මහපොළොව මත ඇති නොවන්නට කටයුතු කළ යුත්තේ කෙසේද යන පැනය විසඳන්න හැක්කේ මෙරට ජාතික ගැටලුවට දිගුකාලීන ජනතාවාදී විසඳුමක් ගෙන එන්නේ නම් පමණි.

නමුත් යුද්ධය අවසන්ව වසර 17 කට පසුත් වත්මන් ජාජබ පාලනය පවා ඔප්පු කරමින් සිටින්නේ තමන්ට ඒ සඳහා කිසිදු වැඩපිළිවෙළක් නොමැති බවය. කලින් සිටි පාලකයන් මෙන් මොවුන්ද කළේ උතුරේ ජනතාව රවටමින් සිය ඡන්ද ගොඩ වැඩි කර ගැනීම පමණි. අදටත් තමන්ගෙන් පැහැර ගත් ඉඩම්වල අයිතිය ඉල්ලා තමිල් ජනතාව පාරට බසිමින් සිටිති. උපවාස ආරම්භ කරමින් සිටිති. ආණ්ඩුව කරන්නේ මුනිවත රැකීම පමණි.

PTA අහෝසි කරන බවට පොරොන්දු වූ වත්මන් ජනාධිපතිවරයා දැන් කිසිදු හිරිකිතයකින් තොරව පවසන්නේ එවැනිම ආකාරයේ තවත් පනතක් ගෙන එන බවය. හෙළිදරව් වී ඇති කරුණුවලට අනුව එය තිබුණු පනතටත් වඩා භයානකය.

පාලකයන් හැමදාමත් කලේ සිංහල තමිල් මුස්ලිම් ජනතාව අතර විරසකභාවයන් ගොඩනැංවීමය. ඒ සඳහා ජාතිවාදය වපුරා සිය බලය තහවුරු කර ගැනීමය. මේ උගුල්වලට නොවැටී ජනතාව කළ යුත්තේ සිය අයිතින් දිනා ගැනීම සඳහා ඒකරාශී වීමය. දෙමළාට, මුසල්මානුවාට හා සිංහලයාට එකිනෙකාට එරෙහිව දිවිපරලුවට තබා සටන්කර දිනාගත හැකි කිසිවක් නොමැත. මේ සියල්ලන්ගේ පොදු සතුරා ධනේශ්වරය බව ඔවුන් ඉබේ අවබෝධ කර නොගනිති. එය ඔවුනට අවබෝධකර දීම වමේ කාර්යභාරයකි.

තවත් කළු ජූලියක් නිර්මාණය නොකර ගැනීම යනු ඒ අවබෝධය තමන් කරා ලඟාකර ගත් බවට වන සාක්ෂියකි..

ඔසප් බද්ද කාන්තාවන්ට ගහන ආර්ථික දඬය

කුසගින්න හා කාන්තා සනීපාරක්ෂාව දෛනික වියදම් තරාදියේ දෙපසට දමා අතට ලැබෙන වැටුප මගින් සමතුළිත කර ගැනීමට උත්සාහ කරයි. සාමාන්‍යයෙන් කුටුම්භ රක්ෂණයෙන් ජල හා විදුලි බිල් ආහාර පාන දරුවන්ගේ අධ්‍යාපන වැනි වියදම් ආවරණය කිරීමෙන් පසු සනීපාරක්ෂක තුවා පැකැට්ටුව කපා හැරීමට සිදුවේ.

ලංකාව දරුණුතම ආර්ථික අර්බුදයකට පිවිසියේ 2019 දීය. මෙම අර්බුදය අධි උද්ධමනය, විදේශ සංචිත ක්ෂය වීම, වෛද්‍ය සැපයුම් සඳහා සීමිත ප්‍රවේශය සහ මූලික භාණ්ඩවල මිල ඉහළ යාමට හේතු විය. මධ්‍යම හා පහළ ආදායම් කාණ්ඩවල පුද්ගලයන් ආදායම් වර්ණාවලියෙන් තවත් පහළට තල්ලු කිරීම නිසා, අඩුවෙන් කතාබහට ලක් වූ බලපෑම්වලින් එකක් වූයේ ආර්තව දරිද්‍රතාවයේ වැඩිවීමකි. ආදායම් ගැටලු මත ඔසප් කාලය තුළ සනීපාරක්ෂක පහසුකම් සපයාගැනීමට නොහැකි තත්වය 'ඔසප් දිළිඳුකම' නැතහොත් 'ආර්තව දරිද්‍රතාව' ලෙස හඳුන්වනු ලබයි.

ලංකාවේ ආනයනික ඔසප් නිෂ්පාදන සඳහා 51.7 % කට ආසන්න බදු අය කරනු ලබන අතර, දේශසීමා තීරුබදු සහ දේශීය වැට් බදු මෙම මුළු බදු අනුපාතයට දායක වේ.

ලංකාවේ කාන්තා සනීපාරක්ෂක තුවායක් මිල දී ගැනීමේදී රජයට ගෙවන බදු වර්ග 5 කි. ඒ අනුව 2026 වසරේ දී

1. වැට් (18% දක්වා)
2. සෙස් බද්ද (10-15% අතර)
3. වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද (PAL) (10%දක්වා)
4. රේගු බද්ද (15% දක්වා)
5. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (2.5%)

ඒ අනුව කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා සඳහා වර්තමාන බදු අනුපාතය 51.07%කි.

සාමාන්‍ය ගෘහනියකට ජීවිත කාලය තුළ රු. 50,000 සිට 80,000 දක්වා බදු ගෙවීමට සිදුවන අතර එය ගෘහනියක් වීම නිසා ගෙවන දඬයකි.

ලංකාවෙ තත්වය මෙසේ වුවත් ලෝකයේ බොහෝ රටවල් මේ සම්බන්ධ කිසිදු බදු පැනවීමක් නොකරන අතර අසල්වැසි ඉන්දියාව ද පසුගිය දිනෙක මේ සඳහා වූ බදු ඉවත් කළේය.

ස්කොට්ලන්තය 2020 දී සනීපාරක්ෂක තුවා සඳහා බදු 0% කළ ලෝකයේ පළමු රට බවට පත්විය. විශේෂයෙන් පාසල්, කාර්යාල සේවාවන්හි නිරත වන කාන්තාවන් සඳහා 2020 සිට නොමිලේ සනීපාරක්ෂක තුවා ලබා දීමට එරට බලධාරීන් සමත් විය.

එක්සත් රාජධානිය 2021 සිට බද්ද 5% සිට 0%දක්වාත් ඉන්දියාව බද්ද 12% සිට 0% දක්වා අඩු කළ අතර කැනඩාව, ඔස්ට්‍රේලියාව එම බදු සම්පූර්ණයෙන්ම අහෝසි කර ඇත. එලෙසම කෙන්යාව, උගන්ඩාව වැනි රටවල බද්ද 0%ක් වන අතර පාසල් දැරියන් සඳහා මෙය 2024 සිට නොමිලේ ලබා දීම නිසා එරට ගැහැනු ළමයින්ගේ පාසල් පැමිණීම 20% කින් වැඩිවිය.

ඔසප් දිළිඳුකම

යුනිසෙෆ් 2022 සමීක්ෂණ වාර්තාවලට අනුව ලංකාවේ පාසල් යන ගැහැනු ළමුන්ගෙන් 30% කට මසකට අවශ්‍ය සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට නොහැකි වීම විසින් පාසල් යාම මග හැරී ඇත. අධ්‍යාපනය ලබන කාලය තුළ මසකට දින පහක් මේ හේතුව මත පාසල් නොයනවා යැයි උපකල්පනය කළහොත් එකී දැරියන්ට වසරකට දින 60ක් පාසල මග හැරී යයි.

සනීපාරක්ෂක ද්‍රව්‍ය අලෙවියට වෙළෙඳපොළ පාරිභෝගිකයකු ලෙස සළකමින් කාන්තාව ගසාකෑම මේ හරහා සියුම් ලෙස සිදුවන්නකි. බැලූ බැල්මට කෙනෙකුට නොපෙනුනත් කාන්තා ජනගහනයෙන් 30% කට වැඩි පිරිසක් මෙම සනීපාරක්ෂක තුවාවල අනිවාර්ය පාරිභෝගිකයන්ය. ඒ වෙළෙඳපොළ පෞද්ගලික සමාගම්වලට අතිවිශාල ලාභයක් ලබා දෙන අතර රජයටද සුවිශාල බදු මුදල් ප්‍රමාණයක් උපයා දෙයි. ඒ අතර ප්‍රමාණාත්මක වැටුප් නොලබන කාන්තාවන් ආර්ථික ප්‍රශ්නය ඉදිරියේ කුසගින්න හා කාන්තා සනීපාරක්ෂාව දෛනික වියදම් තරාදියේ දෙපසට දමා අතට ලැබෙන වැටුප මගින් සමතුළිත කර ගැනීමට උත්සාහ කරයි. සාමාන්‍යයෙන් කුටුම්භ රක්ෂණයෙන් ජල හා විදුලි බිල් ආහාර පාන දරුවන්ගේ අධ්‍යාපන වැනි වියදම් ආවරණය කිරීමෙන් පසු සනීපාරක්ෂක තුවා පැකැට්ටුව කපා හැරීමට සිදුවේ.

වෙනත් විකල්ප ක්‍රම අනුගමනය කිරීමට සිදුවීම නිසා මෞතු ලිංගික පද්ධතිය ආශ්‍රිත ආසාදනය (UTI) පිළිකා අවදානමක් දක්වා වර්ධනය විය හැකිය. ඉන් සිදුවන්නේ කාන්තා ජීවිත අකාලයේ මරණයට ගොදුරු වීමත්, සනීපාරක්ෂක තුවා සඳහා බදු අය කරන ආණ්ඩුවට මෙම රෝග තත්වයන්ට ප්‍රතිකාර කිරීමට ඖෂධ වෙනුවෙන් අතිවිශාල පිරිවැයක් දරන්නට සිදුවීමත්ය. ආර්තව දරිද්‍රතාවය හුදු සනීපාරක්ෂක තුවායක් මිලදී ගැනීමේ නොහැකියාවට වඩා කාන්තා ජීවිත බිලි ගැනීමකි. ලංකාවේ ආනයනික ඔසප් නිෂ්පාදන සඳහා 50% කට ආසන්න බදු අය කරනු ලබන අතර, දේශසීමා තීරුබදු සහ දේශීය වැට් බදු මෙම මුළු බදු අනුපාතයට දායක වේ. ලංකාවේ දේශසීමා බදු යනු තීරුබදු සහ පැරා තීරුබදු ලෙස හඳුන්වන අමතර බදු ගණනාවක මිශ්‍රණයකි. ආනයනික නිෂ්පාදන සඳහා වන බදු, වෙළඳපොලේ තරඟකාරිත්වය අඩු කරන අතර සමස්ත සිල්ලර මිල ඉහළ යාමට හේතු වේ. මෙම මිල ඉහළ යාම සහ එම ඉහළ මිල දැරිය නොහැකි බව, ඔසප් කාලයට අවශ්‍ය නිෂ්පාදන ලබා ගැනීමට නොහැකිවීමට හේතු වේ.

එසේම සෙදීමට පිරිසිදු ජලය නොමැතිකම, ඇඳුම් මාරු කිරීමට අගුළු දැමිය හැකි දොරක් නොමැතිකම, භාවිතා කළ නිෂ්පාදන බැහැර කිරීමට ආරක්ෂිත ක්‍රමයක් නොමැති වීම ද ගැටලුවකි. ඔසප් වීමේදී කාන්තාවන් සහ ගැහැනු ළමයින් සිටින නිවාසවලින් අඩක් පමණ ඔවුන්ගේ ගෘහස්ථ වියදම්වලට සනීපාරක්ෂක තුවා ඇතුළත් නොකරන බවද සමීක්ෂණවලින් හෙළිවී ඇත.

ආණ්ඩුවේ පොරොන්දුවලට එරෙහිව 51.7%ක බද්ද

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය මෙන්ම මැතිවරණ වේදිකා දෙවනත් කළ කතාවල තිබුණු පොරොන්දු හා අද තත්වයත් වෙනස් වන්නේ මේ ආණ්ඩුව ද ජනතා අභිලාෂයන් ට පසුපස හරවන ආණ්ඩුවක් බව සනාත කරමිණි. ඒ අනුව

කාන්තා ආර්ථික සවිබලගැන්වීම මෙන්ම කාන්තාව රටේ තීරණාත්මක බලවේගයක් යැයි ප්‍රකාශ කළේ සනීපාරක්ෂක තුවා සඳහා 51.7% බදු අය කිරීම වෙනුවෙන්දැයි විමසා බැලීම වැදගත්ය.

තවද අධ්‍යාපනය ශක්තිමත් කිරීම 'පාසලෙන් දරුවෙක් අතහරින්නෙ නැත'යැයි පැවසූ ආණ්ඩුවට, මාසික ඔසප් සිදුවීම නිසා අවුරුද්දට දවස් 60ක් දැරියකට පාසල මග හැරීම, අත්‍යවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍යයක් මිලදී ගැනීමට නොහැකි වීම විසින් සිදුවන බව නොතෙනී ගොස් ඇත.

බදු සහන දී ජනතාවට බර අඩු කරනවා කියූ ආණ්ඩුවට ලංකාවේ ජනගහනයෙ විශාල පංගුව වූ කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා සඳහා වූ බද්දඳත් ඉවත් කිරීමට නොහැකි වී තිබේ. ආණ්ඩුව මැතිවරණයට පෙර ලබා දුන් පොරොන්දුවල තිබූ කාන්තා සවිබලගැන්වීම ගැන සූරංගනා කතා කියමින් සෑම මසකම කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා සඳහා වන වියදමින් 51.7% 'සවිබලගැන්වීමේ බද්දක්' අය කරනු ලබයි.

දැන් පමා වී හෝ ආණ්ඩුව කළ යුත්තේ කාන්තා සනීපාරක්ෂක ද්‍රව්‍ය අත්‍යවශ්‍ය සෞඛ්‍ය අවශ්‍යතාවයක් ලෙස සලකා ඒ සඳහා වූ බදු 100% අහෝසි කිරීමය. එසේම පාසල් ශිෂ්‍යවන් සඳහා කාන්තා සනීපාරක්ෂක ද්‍රව්‍ය නොමිලේ ලබා දීම සිදුකළ යුතු අතර ස්කොට්ලන්තය වැනි රටවල 6 ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය දක්වා සියලුම දැරියන්ට පාසල්වලට නොමිලේ ලබා දෙයි. එසේම, සනීපාරක්ෂක තුවා සඳහා සියලු බදු අහෝසි කරමින් කාන්තා සනීපාරක්ෂක ද්‍රව්‍ය සුබෝපභෝගී ලැයිස්තුවෙන් ඉවත් කර අත්‍යවශ්‍ය සෞඛ්‍ය භාණ්ඩ ලැයිස්තුවට එක් කළ යුතුය.

ලංකාවේ ආරක්ෂක වියදම රු. බිලියන 400 ක් පමණ වන අතර රටේ නිෂ්පාදන ක්‍රියාවලියට උරදීමට සිටින ගැහැනු ළමයින් වෙනුවෙන් නොමිලේ සනීපාරක්ෂක තුවා ලබා දීම සඳහා ආරක්ෂක වියදමෙන් 1% කපා හැරීම ප්‍රමාණවත්ය. එලෙසම ගැහැනු එක මිටට කියමින් වහසි බස් දොඩනවා වෙනුවට මේ සඳහා රාජ්‍ය නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුය.

ඉරාන එක්සත් ජනපද සාම සම්මුතිය

2026 පෙබරවාරි 28 එක්සත් ජනපදය - ඊශ්‍රායලය ඒකාබද්ධව ඉරානය ආක්‍රමණය කිරීම මෑත කාලීන දේශපාලන සංදර්භයේ සුවිශේෂී සිදුවීමක් බව ඉතා පැහැදිලිය. පෙන්ටගන-මොසාඩ් සැලසුම වූයේ ඉරාන නායකයන් සමූල ඝාතනය කරමින්, ඉරාන ජනතාව පාලකයින්ට එරෙහිව උසිගන්වමින්, ලෝකයෙන් ඉරානය හුදකලා කරමින් ඉතා කෙටි කලක් ඇතුළත ඉරාන පාලනය අවසන් කර දැමීමය. එහෙත් සති දෙකක් නොව මාස හතරක් ගෙවන තැන එනම් ජූනි 17 වෙනිදා එකගතාවන්ට පැමිණෙන විටද එසේ ඉරාන පාලනය බිමට ඇද දැමීමට ඊශ්‍රායල-එක්සත් ජනපද බල අධිකාරියට හැකිවූයේ නැත. ඉරානය වෙත එහි තෙල් ආකර මර්මස්ථාන වෙත තීරණාත්මක ප්‍රහාර එල්ල කළ ද ඉරාන පාලන තන්ත්‍රය හෝ ඉරාන රාජ්‍යය අත්පත් කර ගැනීමට ආක්‍රමණිකයන්ට නොහැකි විය.

ඒ වෙනුවට ඉරානය සිය ප්‍රතිප්‍රහාර සඳහා ඉතා සියුම් යුද උපක්‍රමික ක්‍රියාමාර්ග වෙත හැරුණු අතර එය ඊශ්‍රායල් එක්සත් ජනපද ආක්‍රමණයන්ට බොහෝ පෙරාතුව සැලසුම් කරන ලද ප්‍රතිප්‍රහාර විය. එහි එක් ප්‍රවේශයක් වූයේ ඉරානයට පහර දෙන හැමවිටම ගල්ෆ් කලාපයේ එක්සත් ජනපද සුරතලුන්ගේ ආර්ථික මර්මස්ථාන වෙත ප්‍රහාර එල්ල කිරීමය. එක්සත් ජනපද මෙන්ම ලෝක ප්‍රාග්ධන ගතිකයන්ට වඩාත් තියුණු තෝතැන්නක් වන ගල්ෆ් කලාපයේ එහි තියුණු සංවේදී ස්ථාන ඉරානයේ ප්‍රහාරයන්ට ලක්විය එක්සත් අරාබි එමිර් කටාර් සවුදි අරාබි ඇතුළු රාජ්‍යන්හි ආර්ථික මර්මස්ථාන ඉරානයේ ප්‍රහාරයන්ට ලක්විය.

එහි අනෙක් ප්‍රධාන හා ආන්දෝලනාත්මක ක්‍රියාමාර්ගය වූයේ හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීමය. චීනය, ඉන්දියාව, ජපානය ඇතුළු ප්‍රධාන බලවත් රටවල මෙන්ම සෙසු රටවල තෙල් ප්‍රවාහනයේ ප්‍රධාන මාර්ගය වැටී ඇත්තේ හෝමුස් හරහාය. එහි ලෝක තෙල් තෙල් සැපයුමෙන් පහෙන් එකක් පමණ ප්‍රවාහනය කෙරෙන අතර යුද්මය තත්ත්වය ඉදිරියේ මේ හරහා තෙල් ප්‍රවාහනයේදී තීරක සාධකය බවට ඉරානය පත්විය. අනිත් පසින් බලශක්ති යටිතල පහසුකම් පමණක් නොව ගල්ෆ් කලාපය තුළ මූලික ජල අවශ්‍යතා සම්පූර්ණ කෙරෙන ජල පිරිපහදු කෙරෙන යන්ත්‍රාගාර වෙත ප්‍රහාර එල්ල කිරීම එකී යාන්ත්‍රණය බිඳ දමන බවට වූ ඉරාන තර්ජනයද මෙහිලා තීරණාත්මක කරුණක් විය.

මේ ආකාරයෙන් සම්ප්‍රදායික නොවන යුද උපක්‍රම වෙත ඉරානය හැරී ගිය අතර, ඉරානයේ පැවැත්ම සඳහා එය අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්විය.

මේ ආකාරයෙන් අසමාන දේශපාලන මිලිටරි බලයන් දෙකක් එක්තරා ආකාරයකින් සටන් වැදීමත් ඒ සටන් ක්‍රියාමාර්ග හමුවේ ඉරාණය පරාජය , යටත්වීම වෙනුවට ශක්තිමත් පෙරමුණක් බවට පත්වීම විසින් යළි උගත යුතු පාඩමක් ද මෙහි ඇති බව අප තේරුම් ගත යුතුය.

එමෙන්ම ඉරාන එක්සත් ජනපද යුද ගැටුම්කාරිත්වය මේ කරුණු මතින් පමණක් තේරුම් ගැනීමට යාම බරපතළ වරදක් වනු ඇත. මෙහි පළමු හා අදටත් හෙටටත් පවතින ඇත්ත වනුයේ වත්මන් ගෝලීය බල ගැටුමත් එයට එක එල්ලේ බලපා ඇති ආර්ථික අර්බුදයත්ය. එක්සත් ජනපදය දෙවන ලෝක යුද තත්ත්වයෙන් පසු අත්පත් කරගත් බලහත්කාරයේ දෘෂ්ටිවාදී ආධිපත්‍යය බිඳ වැටෙමින් තිබේ. එහි ආර්ථික බලය අභියෝගයට ලක්ව හමාරය. එය පෙන්වා දෙන ප්‍රධාන ප්‍රකාශනය පෙට්‍රොඩොලර් ආධිපත්‍යය බිඳවැටීමය. තවද ඉරානයට එරෙහි ප්‍රහාරයන්ට මෙවර නේටෝව සම්බන්ධ නොවීම ද සුවිශේෂ කරුණකි. මෙතෙක් ඉතිහාසයේ එක්සත් ජනපද ආක්‍රමණ සඳහා සහායක බලඇණියක් වූයේ නේටෝවයි. ඒ හා සමගම ප්‍රකාශයට පත්වන අනෙක් කරුණ වනුයේ ආර්ථික මිලිටරි බලවතෙකු ලෙස චීනයේ නැගී ඒමය.

> **එහි අනෙක් ප්‍රධාන හා ආන්දෝලනාත්මක ක්‍රියා මාර්ගය වූයේ හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීමය.චීනය, ඉන්දියාව, ජපානය ඇතුළු ප්‍රධාන බලවත් රටවල මෙන්ම සු හෝ රටවල තෙල් ප්‍රවාහනය ප්‍රධාන මාර්ගය වැටී ඇත්තේ හෝමුස් හරහාය. එහි ලෝක තෙල් තෙල් සැපයුමෙන් පහෙන් එකක් පමණක් ප්‍රවාහනය රෙන අතර යුද මය තත්ත්වය ඉදිරියේ මේ හරහා තෙල් ප්‍රවාහනයේදී තීරක සාධකය බවට ඉරානය පත්විය.**

එක්සත් ජනපද ආක්‍රමණය සඳහා ඉරානය වෙතට ද කඩා වැදීමටය.

සැබවින්ම එය සාර්ථක වී නම් වඩාත් පාඩු වන්නේ චීන වෙළෙඳ ඒකාධිකාරයටය. වෙනිසියුලානු තෙල් සැපයුමෙන් 55% පමණද ඉරාන තෙල් සැපයීමෙන් 87%ක පමණ ප්‍රමාණයක් චීනය විසින් පරිබෝජනය කරයි.

චීන බල ශක්ති අවශ්‍යතාවයන් සැලකීමේදී ඉරාන තෙල් සැපයුම ඉතා වැදගත් සාධකයකි. ඉරාන පාලනය එක්සත් ජනපද හිතවාදී පාලනයක් දක්වා හැරවූයේ නම් 1979 ඉරාන අයතුල්ලා කොමෙයිනි පාලනයන් ප්‍රවේශයන් සමග එක්සත් ජනපදය මුහුණ පෑ තෙල් අර්බුදයට සමාන ගැටුමකට චීනය මේ මොහොතේ පත්වනු ඇත.

එනිසා එක්තරා ආකාරයක 'ප්‍රොක්සිවෝ' (එකිනෙකා අභිමුඛ නොවී වෙනත් ක්‍රමවලට කෙරෙන යුද්ධයක්) තත්වයක් මෙහි පවතී.

ඇත්ත ගැටුම ලෝක බල තුලනය හා ආර්ථික වශයෙන් එක්සත් ජනපදය යළිත් තමන්ගේ පැරණි භූමිකාවට පණ පෙවීමය. ඒ සඳහා මැද පෙරදිග ඊශ්‍රායල සමග එක පෙරමුණකට අවතීර්ණ වීමය. ඒ සමග එය ඊශ්‍රායලයේ ජාතිකවාදී ව්‍යාප්තවාදී දේශපාලනය සමග එකට ගමන් ගත් අතර ඊශ්‍රායලය ඉන් විපුල ප්‍රයෝජන අත්පත් කරගත්තේය. එමගින් වඩාත් අනතුරුදායක තත්වයක් මැද පෙරදිග කලාපය තුළ දැනටමත් නිමවා අවසන්ය. ඊට හොඳම නිදසුන වනුයේ ඊශ්‍රායලය විසින් ලෙබනනය අත්පත් කරගැනීම දක්වා දියත් කොට ඇති ආක්‍රමණකාරී යුද්ධයයි.

එකඟතාවයට ආ ගිවිසුම් ප්‍රකාරව ලෙබනන් ආක්‍රමණය නතර කිරීමට එක්සත් ජනපද එකඟතාවය පැවතියද ඊශ්‍රායලය විසින් අඛණ්ඩව ලෙබනන් භූමිය අත්පත් කරගැනීම් දිගින් දිගට සිදුවීම විසින් ඊශ්‍රායල් ස්ථාවරය පෙන්වා දෙයි. පෙරලා ඉරානය කියා සිටියේ ලෙබනන් ආක්‍රමණය දිගින් දිගට සිදුවන්නේ නම් හෝමුස් යළි වසා තැබීමට තමන් කටයුතු කරන බවයි.

ගල්ෆ් කලාපයේ බලය ව්‍යාප්ත කිරීමට ඉඩ දෙන අතර ඊශ්‍රායලය එක්තරා පාලිත මට්ටමකින් පවත්වාගෙන යෑමට කෙනඩි ඔබාමා වැනි පාලනයන් වරෙක මැදිහත්විය. පලස්තීන භූමිය යළි යළිත් අල්ලා ගනිමින් ඊශ්‍රායල් ජනපද නිර්මාණය කිරීමට එරෙහිව ඔබාමා පාලනය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග යෝජනාවක් සම්මත කර ගැනීමටද වෙර දැරිය. එහෙත් ට්‍රම්ප් සිය ගමන ආරම්භ කළේ වඩාත් විනාශකරී බලයක් ඊශ්‍රායලය වෙත අත් කර දෙමිනි. එහි ප්‍රතිඵලය වඩාත් හොඳින් දැන් පලස්තීනය මෙන්ම ලෙබනනය වෙතිනුත් ප්‍රකාශමාන වේ.

එක් පැත්තකින් ඊශ්‍රායල් ව්‍යාප්තවාදය හා එක්සත් ජනපදය මුහුණ දී ඇති අර්බුදයත් බල දේශපාලන ගැටුමත් හා අනේපසින් යටත් නොවන ඉරානයේ භාවිතාවත් විසින් කලාපීය මෙන්ම ලෝක බල දේශපාලනයේ යළි යළිත් සිදුවන උත්සන්නීන් අනිවාර්යයක් කොට ඇත .

අධිරාජ්‍යවාදී බලපොරය නැවත නැවතත් සිදුවන වෙළඳපළ බෙදා ගැනීමේ ගැටුම් ඒවා පාලනය සඳහා සිදුකරන යුද්ධය ක්‍රියාමාර්ග විසින් ලෝක පරිමාණ ආර්ථික අර්බුදය වඩාත් තීව්‍ර කරමින් පවතින බැව් ඉතා පැහැදිලිය .එනිසා ජූනි 17 දා එකඟතාවයන් විසින් කියා දෙන්නේ ,අධිරාජ්‍යවාදී බල කඳවුරු අතර තාවකාලික එකඟතා මිස දිගු කාලීන පිළිතුරක් නොවන බව පැහැදිලිය. පිළිතුර ඇත්තේ ලෝක පරිමාණව පෙලා ගැසෙමින් එන යුද විරෝධයන් ඇත්ත අදිරාජ්‍ය විරෝධයක් දක්වා පෙළගස්වමින් ජනතා ජයග්‍රහණයන් දක්වා සටන් වැදීමය.

එල් නිනෝ ගොඩිසිලා කෙනෙක් වෙයිද?

විදෙස්

ලෝකයම 'එල් නිනෝ' නැමැති ගෝලීය උෂ්ණත්වය වැඩි කරන 'ස්වභාවික' පැසිෆික් කාලගුණ රටාව ආරම්භ වීම සම්බන්ධයෙන් බිය පළකරමින් සිටියි. පසුගියදා පැසිෆික් සාගරයේ නිවර්තන කලාපයේ එල් නිනෝ තත්වයන් ආරම්භ වී ඇති බව එක්සත් ජනපද ජාතික සාගර හා වායුගෝලීය පරිපාලනය (NOAA) නිවේදනය කර ඇත්තේ මෑත මාසවලදී මුහුදු මතුපිට උෂ්ණත්වය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති පසුබිමක යි.

බොහෝ අනාවැකිවලින් පෙනී යන්නේ මෙම එල් නිනෝව පැවසෙන පරිදි ම 'සුපිරි' එල් නිනෝවක් විය හැකි බවයි. ඒ අනුව මෙම තත්වය 'Godzilla' El Nino ලෙස නම් කර ඇත.

ගෝලීය උණුසුම් ඉහළ යාමට සාපේක්ෂව එල් නිනෝ තත්වය විසින් බොහෝ විට 2027 වසර තවත් වාර්තාගත උණුසුම් වසරක් වීමට ඉඩ තිබේ. එය විසින් කාලගුණික රටා, ආහාර සැපයුම් සහ ආර්ථිකයන්ට බාධා ඇති කළ හැකි බව විශේෂඥයන්ගේ අදහසයි.

එල් නිනෝවක තීව්‍රතාවය මනිනු ලබන්නේ පැසිෆික් සාගරයේ ප්‍රධාන කලාපයක මුහුදු ජලයේ මතුපිට උෂ්ණත්වය සාමාන්‍යයට වඩා කෙතරම් දුරට ඉහළ යනවා ද යන්න මතය. මේ හේතුවෙන් සමස්ත ලෝකයේම වායු සංසරණ රටාව වෙනස් වී, ඇතැම් කලාපවලට දැඩි නියඟයත්, තවත් කලාපවලට අධික වර්ෂාව සහ ගංවතුරත් ඇති වේ.

ලෝක කාලගුණ විද්‍යා ආයතනය (WMO) පවසන පරිදි දකුණු ඇමරිකාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ දකුණු ප්‍රදේශවල, අප්‍රිකාවේ අඟ (Horn of Africa) ලෙස හැඳින්වෙන නැගෙනහිර අප්‍රිකාවේ සමහර ප්‍රදේශවල සහ මධ්‍යම ආසියාවේ වර්ෂාපතනය වැඩි කිරීමට එල් නිනෝ හේතු විය හැකිය. එය ඕස්ට්‍රේලියාව, මධ්‍යම ඇමරිකාව, ඉන්දුනීසියාව සහ දකුණු ආසියාවේ සමහර ප්‍රදේශවල නියඟයට හේතු විය හැකි අතර මධ්‍යම හා නැගෙනහිර පැසිෆික් කලාපයේ සුළි කුණාටු ඇතිවීමට ද හේතු විය හැක.

ඉන්දියාවේ මෝසම් වර්ෂා ආරම්භය ප්‍රමාද වීම දැනටමත් ඒ අවදානමේ පළමු සංඥාවක් ලෙස සැලකේ.

ආහාර අර්බුදය

නියඟයක් ඇති වුවත් වර්ෂා අධික කාලයක් ඇතිවුවත් මේ හරහා සිදුවිය හැකි ප්‍රබලම ප්‍රතිවිපාකය බවට පත්වනු ඇත්තේ ලෝකය විශාල ආහාර අර්බුදයකට මුහුණ දීමේ අවදානමයි. ලෝක බැංකුව අනතුරු අඟවා ඇත්තේ, ආහාර මිල ඉහළ යෑම පිළිබඳ වර්තමාන අපේක්ෂාවන්වත් වඩා වැඩි පීඩනයක් එල් නිනෝ හේතුවෙන් ඇතිවිය හැකි බවයි. මෙය සිදුවන්නේ, මැදපෙරදිග අර්බුද සහ ඉරානය ආශ්‍රිත යුද උණුසුම් හේතුවෙන් පොහොර හා ඉන්ධන පිරිවැය දැනටමත් ඉහළ මට්ටමක පවතින අවස්ථාවකය. එනම්, ලෝක ආහාර පද්ධතියට එකවර අපනයන තහනම් පැනවීමට බොහෝ දුරට ඉඩ ඇත. ඕස්ට්‍රේලියාවේ තිරිඟු නිෂ්පාදනයේ සිදුවිය හැකි අඩුවීම් ද මේ ආකාරයට මුළු ලෝකයේම ආහාර මිල ඉහළ යාමට බලපෑමේ හැකියාවක් පවතියි.

ලංකාවට සිදුවිය හැකි බලපෑම

ශ්‍රී ලංකාවට එල් නිනෝ කාලගුණ සංසිද්ධියේ බලපෑම අවම මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ලීල් රන්දෙණිය ප්‍රකාශ කළේ, එල් නිනෝ හි යම් බලපෑමක් මතු වුවහොත් එය ලබන වසරේ පෙබරවාරි මාසයෙන් පසුව පමණක් සිදුවනු ඇති බවට කාලගුණ විද්‍යාඥයන් අනාවැකි පළ කර ඇති බවයි. එසේම ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය වෙනුවෙන් ආචාර්ය රංජිත් පුණ්‍යවර්ධන පසුගියදා මේ සම්බන්ධව පැවති දේශනයකදී සඳහන් කළේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම හේතුවෙන් ඉතා සංකීර්ණ දේශගුණික පද්ධතියක් යැපෙන බැවින්, සෘතුමය වර්ෂාපතනයේ සුළු අඩුවීමක් පවා ආහාර නිෂ්පාදන අවශ්‍යතා සහ විදුලි උත්පාදනය අතර ක්ෂණික ගැටුමක් ඇති කිරීමට හේතුවන බව නොරහසකි.

ලංකාව මේ සඳහා සූදානම් ද?

ලංකාව එල් නිනෝ තත්ත්වයක් ඇතිවුවහොත් සහ ඉන් ඇතිවෙන ලෝක බලපෑමට සූදානම්ද යන්න ඊට පසු මතුවන ප්‍රශ්නයයි. ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනයේ ආචාර්ය රංජිත් පුණ්‍යවර්ධන පවසන පරිදි ලංකාවේ ඇති වන දැඩි කෘෂිකාර්මික හා ජල හිඟයන් තනි ගෝලීය විෂමතාවයක් නිසා සිදුවන්නේ කලාතුරකිනි. ඒ වෙනුවට එකිනෙකට බැඳුණු පීඩනයන් තුනක් හේතුවෙන් දේශීය නියඟයන් තීව්‍ර වේ. මෝසම් වැසි ආරම්භ වීම සහ එහි ව්‍යාප්තියේ සිදුවන ඉතා දේශීයකරණය වූ විෂමතා,

පසෙන් සහ ශාක වලින් ජලය වාෂ්ප වීමේ වේගය (evapotranspiration rate) ඉහළ නංවන පරිසර උෂ්ණත්වයේ තියුණු වැඩිවීම් සහ ප්‍රාදේශීය ජල ගබඩා කිරීම සහ බෙදා හැරීමේ යටිතල පහසුකම්වල පවතින අඩුපාඩු යන්නයි.

එසේම එල්නිනෝ තත්වයකදී ඇතිවිය හැකි පලවිපාක මගහරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේදය ගැනද විශේෂඥයන්ගේ අවධානය යොමුව තිබේ. ඉන් එක පියවරක් වන්නේ වගා කටයුතු සඳහා සාම්ප්‍රදායික සංස්කෘතික දින වකවානු මත යැපෙනවා වෙනුවට, කෘෂිකර්ම දෙපාර්තමේන්තු විසින් දත්ත මත පදනම් වූ දිනදර්ශන බලාත්මක කිරීමයි. සැබෑ මෝසම් හැසිරීම්වලට ගැළපෙන පරිදි වගා කාලසීමාවන් සකස් කිරීම සෘතුමය රෝග අස්වැන්න ආරක්ෂා කර ගත හැකිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ජල කළමනාකරණ බලධාරීන් අතර ජාල හිඟයක් ඇති වීමට පෙර ජලාශ භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා ක්ෂණික, පූර්ව සෘතුමය දත්ත හුවමාරුවක් පවත්වා ගැනීම. එසේම රෝග තේරීම සහ වාරිමාර්ග කාලසටහන් පිළිබඳ ගොවීන් සමඟ සාකච්ඡා කර සැලසුම් සකස් කිරීම අත්‍යවශ්‍ය බව ඔවුන් පෙන්වා දෙයි.

නමුත් මේ කිසිවක් සඳහා අපේ රටේ ආණ්ඩු සූදානම් බවක් පෙනෙන්නට නැත. ගොවි සංවිධාන චෝදනා කරන්නේ ආණ්ඩුව එල් නිනෝ තත්වයට තබා දැනට උද්ගතව පවතින වී මිලදී ගැනීමේ අර්බුදය සඳහාවත් උත්තරයක් නොමැති බවයි. ඉදිරියේ අත්විය හැකි ආහාර අර්බුදයක් සඳහා ආහාර තොග රැස්කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර ආණ්ඩුව තවමත් මැසිවිලි නගමින් සිටින්නේ ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම් ගැනයි. එසේම දැනට මතුව ඇති පොහොර අර්බුදය සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම පාලනය සම්බන්ධයෙන්ද ආණ්ඩුවට වැඩපිළිවෙලක් ඇති බව නොපෙනේ.

එල් නිනෝ තත්ත්වය විසින් ආහාර නිෂ්පාදනය, බෙදාහැරීම හා ගබඩාකරණය යන සියල්ල හරහා අධික ලාභයක් ලැබීමට ලංකාවේ මෙන්ම ලෝකයේ ආහාර නිෂ්පාදන සමාගම් සඳහා අවස්ථාව සලසා දෙනු ඇත. ඒ අනුව ගොඩසිලා තත්වයට පත්වෙමින් ජනතාව ගිල දමනු ඇත්තේ එල් නිනෝ දේශගුණික තත්වය පමණක් නොව ලෝක ආහාර සමාගම් බව පැහැදිලිය

වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත
2026 ජූලි

ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානයේ 6වන ජාතික සමුළුව ජූනි 09 නුවර, තැපැල් ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී..

දරුවන්ට එරෙහිව සිදුවන විවිධාකාරයේ හිංසන හා ප්‍රචණ්ඩත්වයට එරෙහිව ශක්තිමත් සමාජ කතිකාවක් ගොඩනැගීම සහ අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු විවෘත සාකච්ඡා සභාවක් 'ළමා සුරක්ෂාව පිළිබඳව සමාජ සම්මුතියක්' මැයෙන්, ජූනි 12 ජාතික පුස්තකාල සේවා හා ප්‍රලේඛන මණ්ඩල ශ්‍රවණාගාරයේ දී පැවැත්වුණි. මෙම අවස්ථාව සඳහා සමාජ ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන්, නීතිඥවරුන් සහ දේශපාලන ක්‍රියාකාරීන් සම්බන්ධ විය.

නිහඬතාවය බිඳිමු අපයෝජනයට එරෙහි වෙමු' යන තේමාවෙන් මැයි 19 දින නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය විසින් නීතිපති දෙපාර්තමේන්තුව ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණය

'මුල්ලිවයික්කාල් වලින් ඉතිහාසය අවසන්ද?' යන තේමාව යටතේ සම අයිතිය ව්‍යාපාරය විසින් සංවිධානය කරන ලද 16 දින සම්මන්ත්‍රණයේ සමහර අවස්ථා.

කාන්තාවන්ට හා දරුවන්ට සිදුවන අපයෝජන හා ප්‍රචණ්ඩත්වයන් පිටුදකිමු යන තේමාවෙන් මැයි 29= ත්‍රිකුණාමල පොලිස් ස්ථානය ඉදිරිපිට පැවති උද්ඝෝෂණය සඳහා නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරයද එක්විය.

සියලු ජාතික ජනකොටස්වලට සම අයිතිය හිමි වන දේශපාලන විසඳුමක් ලබා දෙන ලෙස බල කරමින් සම අයිතිය ව්‍යාපාරය 2026.06.02 දින යාපනයේ පැවැත් වූ පාගමන...

ත්‍රිකුණාමලය මුත්තු නගර් ඉඩම් ගැටලුවට අදාළව චීන වරාය පොලීසිය කරන අනීතික මැදිහත්වීම් පිළිබඳව මානව හිමිකම් කඩවීම සම්බන්ධ පැමිණිල්ලක් ජූනි 26 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවට ගොනු කෙරුණු අතර ඉන්පසු අගමැති කාර්යාලයට ගොස් සාකච්ඡාවක්ද සිදු කරන ලදී

කාන්තාවන්ට හා දරුවන්ට සිදුවන අපයෝජන හා ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ විරෝධතා බැනර් අත්සන් කිරීමට නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය කටයුතු කරන ලදී.

අංක 22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ යන ලිපිනයේ පදිංචි පුබුදු ජයගොඩ වන මා විසින් අංක 271/, රත්නපුර පාර, හොරණ හි පිහිටි ස්ටාර් ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.